2020

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT



GALLE
HERITAGE
FOUNDATION

ගාලු උරුමය පදනම

ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

காலி மரபுரிமை மன்றம்
தேசிய மரபுரிமைகள், அருங்கலைகள் மற்றும் கிராமிய சிற்பக்கலைகள் மேம்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சு

Galle Heritage Foundation

State Ministry of National Heritage, Performing Arts and Rural Arts Promotion

2020 වාර්ෂික වාර්තාව

GALLE
HERITAGE
FOUNDATION

ගාලු උරුමය පදනම

ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන

කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ලිපිනය	:-	අංක 12, රැම්පාට් වීදිය, කොටුව, ගාල්ල.
දුරකථන අංක	:-	091-2246784 / 091-2231982
ෆැක්ස් අංකය	:-	091-2246784
ඊ මේල්	:-	herifo@sltnet.lk
වෙබ් අඩවිය	:-	www.galleheritage.gov.lk

පටුන

I වෙනි පරිච්ඡේදය

ගාලු උරුමය පදනම

1.1 හැඳින්වීම.....3

1.2 දැක්ම මෙහෙවර හා අගයන්.....3

1.3 ගාලු උරුමය පදනමට අයත් භූමි ප්‍රදේශය.....4

1.3.1 ලෝක උරුම ගාලු කොටුවේ සිතියම.....4

1.3.2 ගාලු කොටුවේ භෞතික පරිසරය.....5

1.3.3 ගාලු කොටුවේ ජනගහන තොරතුරු.....5

1.4 ගාලු උරුමය පදනම මූලික අංශ.....6

1.5 ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන.....7

1.6 ගාලු උරුමය පදනම කාර්ය මණ්ඩලය.....8

1.6.1 කාර්ය මණ්ඩලයේ වැටුප් පරිමාණ.....9

1.6.2 කාර්යමණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු.....10

1.6.3 කාර්ය මණ්ඩලයේ ඇති වූ වෙනස්කම් 2020- වසර.....11

1.6.4 ගාලු උරුමය පදනම් සේවය කළ සභාපතිවරු පිළිබඳ තොරතුරු.....11

1.6.5 16 ගාලු උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරය දරුවන්ගේ තොරතුරු.....12

1.6.6 ගාලු උරුමය පදනම පරිපාලන නිලධාරී තනතුර දැරූ අයගේ තොරතුරු.....12

1.7 ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය.....13

1.7.1 ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් 2020 වර්ෂය.....13-15

II වැනි පරිච්ඡේදය

2.1 ගාලු උරුමය පදනම 2006 සිට 2019 දක්වා සිදුකර ලද කාර්යයන්.....16-53

2020 වර්ෂය

3.1 සංවර්ධන ව්‍යාපෘති.....54-58

4.1 2020.12.31 දිනෙන් අවසන් වන විගණකාධිපති වාර්ථාවේ සිංහල පිටපත.....59-66

5.1 2020 වර්ෂය කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව.....67

6.1 කාර්ය සාධනය වර්ධනය කරගැනීම කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන මධ්‍යකාලීන ක්‍රියාමාර්ග.....68

7.1 අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු විය යුතු ආයතනයට අදාළ වෙනත් කරුණු.....68

8.1 2020 වර්ෂයේ විගණකාධිපති විමසුම් අනුව ගෙන ඇති ක්‍රියාමාර්ග.....69-79

9.1 වාර්ෂික වාර්තාවේ දෙමළ පරිවර්ථනය.....80-143

10.1 2020.12.31 දිනෙන් අවසන් වන දිනට විගණකාධිපති වාර්තාවේ වාර්තාවේ දෙමළ පිටපත.....144-151

11.1 වාර්ෂික වාර්තාවේ ඉංග්‍රීසි පරිවර්ථනය.....152-195

12.1 2021.12.31 දිනෙන් අවසන් වන දිනට විගණකාධිපති වාර්තාවේ ඉංග්‍රීසි පිටපත.....196-202

13.1 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය.....203-220

14.1 2020 වර්ෂය තුළ ගාලු උරුමය පදනමේ කාර්යසාධනය පිළිබඳව සංෂිප්ත වාර්තාව ඉංග්‍රීසි.....221

15.1 කාර්යසාධනය වර්ධනය කරගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග ඉංග්‍රීසි පිටපත.....222

I වැනි පරිච්ඡේදය

ගාලු උරුමය පදනම

1.1 හැඳින්වීම

ගාලු උරුමය පදනම 1994 අංක 07 දරණ පාර්ලිමේන්තු පනත මගින් රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පිහිටුවනු ලැබීය. එහි ප්‍රධාන අරමුණු වූයේ ගාලු කොටුව සහ එහි ඓතිහාසික පශ්චාත් භූමිය ප්‍රවර්ධනය කිරීම , ආරක්ෂා කිරීම ,සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීමයි .මෙතෙක් විවිධ අමාත්‍යාංශ යටතට පත්වූ ගාලු උරුමය පදනම වර්තමානයේ ජාතික උරුම,ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ගාලු කොටු පවුර පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස 1971 දී ගැසට් කිරීමත්, 1988 දී යුනෙස්කෝව විසින් ලෝක උරුම ස්ථානයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම හේතු කොටගෙන රජයේ සහ මහජනයාගේ වැඩි අවධානය එයට යොමුවීමත් සමඟ මෙහි ආරක්ෂාව හා සංරක්ෂණය සඳහා ගාලු උරුමය පදනම විසින් විවිධ පියවර ගනු ලැබිණ.

1.2 දැක්ම මෙහෙවර සහ අඟයන්

දැක්ම

''2025 දී ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම සංස්කෘතික සංචාරක පුරවරය ජීවමාන ලෝක උරුම ගාලු කොටුවයි''

මෙහෙවර

ඓතිහාසික සංස්කෘතික මධ්‍යස්ථානයක් සහ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා විශිෂ්ඨතම සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීම .

අඟයන්

1. සුවිශේෂී විශ්වීය වටිනාකම ලෝක උරුමයක් ලෙස ගාලු කොටුවේ සංවර්ධනයට දායක වීම.
2. ගාලු කොටුවේ සුවිශේෂී පුරාවිද්‍යාත්මක වටිනාකම් ආරක්ෂා කරන අතරම, ආකර්ෂණීය සංචාරක පුරවරයක් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.
3. ප්‍රජා මතයන්ට ගරු කරමින් තීන්දු තීරණ ප්‍රජා සහභාගීත්වයද ලබාගනිමින් ලෝක උරුමයක් ලෙස ගාලු කොටුව පවත්වාගෙන යාම.
4. ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීමට සෘජුව හා වක්‍රව දායක වීම.

1.3 ගාලු උරුමය පදනමට අයත් භූමි ප්‍රදේශය

යුනෙස්කෝ ආයතනය මගින් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ගාලු කොටුව ගාලු උරුමය පදනමේ වපසරියට අයත් වේ. මෙහි මුර අට්ටාල 14කින් සමන්විත වන අතර කොටු බැම්මේ දිග ප්‍රමාණය ආසන්න වශයෙන් කි.මී. 2.5කින් සමන්විත වේ.

1.3.1 ලෝක උරුම ගාලු කොටුවේ සිතියම



ගාලු උරුමය පදනම මගින් සංරක්ෂණය කොට ගාල්ල ඉතිහාසය පිළිබිඹු වන ගැලරියක් බවට පරිවර්තනය කිරීමට අදහස් කර ඇත්තේ සඳු අට්ටාලයේ පිහිටි යුධ කාමරයයි.

1.3.2 ගාලු කොටුවේ භෞතික පරිසරය

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පිහිටි 96 ඩී ග්‍රාමසේවා වසම ගාලු කොටුවට අයත් ප්‍රදේශය වේ. ප්‍රමාණයෙන් අක්කර 80.9067 (හෙක්ටයාර් 32.7418) ක භූමි භාගයකින් ගාලු කොටුව සමන්විත වේ.

1.3.3 ගාලු කොටුවේ ජනගහන තොරතුරු

ගාලු කොටුවේ ජනගහන තොරතුරු 2020.12.31 වන විට පහත ආකාරයෙන් වේ.

ජාතීන් අනුව ජනගහනය

ජාතිය	සිංහල	දෙමළ	මුස්ලිම්	බර්ගර්	මැලේ	මුළු ජනගහනය
ජනගහනය	517	12	520	7	-	1,056

(මූලාශ්‍රය :- කඩවත්සතර ප්‍රා.ලේ.කා.)

ආගම අනුව ජනගහනය

ආගම	බෞද්ධ	හින්දු	ඉස්ලාම්	රෝමානු කතෝලික	වෙනත්	මුළු ජනගහනය
ජනගහනය	514	10	520	12	-	1,056

(මූලාශ්‍රය :- කඩවත්සතර ප්‍රා.ලේ.කා.)

ජාතිය අනුව පවුල් ගණන

ජාතිය	සිංහල	දෙමළ	මුස්ලිම්	බර්ගර්	මැලේ	මුළු පවුල් ගණන
පවුල් ගණන	87	3	110	2	-	202

(මූලාශ්‍රය :- කඩවත්සතර ප්‍රා.ලේ.කා.)

වයස් කාණ්ඩය අනුව ජනගහනය

වයස් කාණ්ඩය	අවු 0-4	අවු 5-10	අවු 11-20	අවු 21-30	අවු 31-40	අවු 41-50	අවු 51-60	අවු 60 ට වැඩි	මුළු ජනගහනය
ජනගහනය	18	14	16	195	178	221	194	220	1056

(මූලාශ්‍රය :- කඩවත්සතර ප්‍රා.ලේ.කා.)

1.4 ගාලු උරුමය පදනමේ මූලික අංශ



1.5 ගාලු උරුමය පදනමේ සංවිධාන සටහන

අනුමත කාර්යය මණ්ඩලය ඇතුළත් සංවිධාන සටහන



6 ගාලු උරුමය පදනමේ කාර්යය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති
2.	සුනිල් දහනායක මහතා	අධ්‍යක්ෂ
3.	ඩබ්.ආර්.පී. අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරී
4.	එල්.ඒ. තරංග පුෂ්පකුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
5.	පී.ජී.එන්. වන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
6.	එස්.පී. ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
7.	එන්.රිද්මි යසිතා මිය	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී
8.	බී.එස්. ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර
9.	ඩබ් .ඩිලානි හර්ෂිකා මෙනවිය	කළමනාකරණ සහකාර
10.	එම්.එච්. ඉෂානි ප්‍රියදර්ශනි මිය	කළමනාකරණ සහකාර
11.	එම්.එච්.ෆාතිමා ෆවුසනා මිය	කළමනාකරණ සහකාර
12.	ඒ.ජී.සමන් කුමාර මයා	කාර්යාල කාර්ය සහායක
13.	එම්.එල්.එස්.ජයසේකර මයා	ආරක්ෂක නියාමක
14.	ඩබ්.ජී.නන්දන සමන් මයා	ආරක්ෂක නියාමක
15.	එම් .එන්.ඊ.ශිරන්ත ද සිල්වා මයා	රියදුරු

1.6.1 කාර්යය මණ්ඩලයේ වැටුප් පරිමාණ

අනු අංකය	තනතුර	වැටුප් සංකේත අංකය	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
1.	සභාපති	පී ඩී 3/2015 වක්‍රලේඛය පරිදි දීමනා ගෙවා ඇත	01	01
2.	අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී	එම් එම් 1-1	01	01
3.	පරිපාලන නිලධාරී	ජේ එම් 1-1	01	01
4.	ගිණුම් නිලධාරී	ජේ එම් 1-1	01	01
5.	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	එම් එන් 4	05	03
6.	ව්‍යාපෘති සහකාර (ගිණුම්)තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	එම් ඒ 3	01	01
7.	කළමනාකරණ සහකාර	එම් ඒ 1-1	04	04
8.	කාර්යාල කාර්ය සහයක	පී එල් 1	01	01
9.	ආරක්ෂක නියාමක	පී එල් 1	04	02
10.	රියදුරු	පී එල් 3	01	01

1.6.2 කාර්ය මණ්ඩලයේ සේවා කාලය පිළිබඳ තොරතුරු

අනු අංකය	නම	තනතුර	සේවා කාලය
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති	2020.01.24 සිට මේ දක්වා
2.	සුනිල් දහනායක මහතා	අධ්‍යක්ෂ	2020.08.19 සිට මේ දක්වා
3.	සීතා . පී.ලියනගේ මිය	පරිපාලන නිලධාරී	2006.01.02 සිට 2020.09.04
4.	ඩබ්.පී.ආර් අනුරුද්ධ මයා	ගිණුම් නිලධාරී	2017.07.17 සිට මේ දක්වා
5.	එල්.ජී.තරංග පුෂ්පකුමාර මයා	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
6.	පී.ජී.එන් .වන්දිමාලි මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2006.08.01 සිට මේ දක්වා
7.	එස්.පී.ලොකුලියන මිය	ව්‍යාපෘති සහකාර තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2015.04.28 සිට මේ දක්වා
8.	එන්.රිද්මි යසිතා මිය	ව්‍යාපෘති සහකාර (ගිණුම්) තනතුරට අනුයුක්ත සංවර්ධන නිලධාරී	2020.05.12 සිට මේ දක්වා
9.	බී.එස්.ඉලේපෙරුම මිය	කළමනාකරණ සහකාර (තා.නො)	2005.11.02 සිට මේ දක්වා
10.	ඩිලානි හර්ෂිකා වික්‍රමසූරිය මෙ.වි.	කළමනාකරණ සහකාර (තා.නො)	2015.09.01 සිට මේ දක්වා
11.	එම්.එච්.ඉෂානි ප්‍රියදර්ශනි මිය	කළමනාකරණ සහකාර (තා.නො)	2015.09.01 සිට මේ දක්වා
12.	එම්.එච්.ෆානිමා ෆවුසානා මිය	කළමනාකරණ සහකාර (තා.නො)	2015.09.01 සිට මේ දක්වා
13.	ඒ.ජී.සමන් කුමාර මයා	කාර්යාල කාර්ය සහායක	2012.12.03 සිට මේ දක්වා
14.	එම්.එල්.එස්.ජයසේකර මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා
15.	ඩබ්.ජී.නන්දන යමන් මයා	ආරක්ෂක නියාමක	2012.12.03 සිට මේ දක්වා
16.	නෙව්මාල් ශිරන්ත ද සිල්වා මයා	රියදුරු	2012.12.03ට මේ දක්වා

1.6.3 කාර්ය මණ්ඩලයේ ඇති වූ වෙනස්කම් 2020 -වසර

- 2019.11.17 දිනෙන් සභාපති ධුරය හෙබවූ වරලත් වාස්තු විද්‍යාඥ වන්න දාස්වත්ත මහතා සේවය අවසන් කල පසු 2020.01.23 දක්වා සභාපති ධුරය සඳහා කිසිදු පත් කිරීමක් සිදු නොවිය.
- 2020.04.25 දිනෙන් අධ්‍යක්ෂ ධුරය හෙබවූ සී.කේ.එස්.ජයලක්ෂ්මී මියගේ සේවා කාලය අවසන් වීමෙන් පසු 2020.08.18 දින දක්වා අධ්‍යක්ෂ ධුරය හෙබවීම සඳහා කෙනෙකු පත්කර නොමැත.
- පරිපාලන නිලධාරී සීතා පී. ලියනගේ මියගේ සේවා කාලය 2020.09.04 අවසන් විය. 2020.12.31 වනතුරුත් පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවති.

1.6.4 ගාලු උරුමය පදනමේ සේවය කළ සභාපතිවරු පිළිබඳ තොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	රූපා කරුණාතිලක මැතිතුමා (ගරු වැවිලි කාර්මාන්ත අමාත්‍ය)	1989	1994
2.	නෙවිල් කනකරත්න මැතිතුමා (ආණ්ඩුකාර දකුණු පළාත් ගරු)	1994	2000
3.	ආචාර්ය රිවඩ් පතිරණ මැතිතුමා	2000	2002
4.	රියෙන්සි විජේතිලක මැතිතුමා (හැටන් නැෂනල් බැංකුව ,සභාපති)	2002	2003
5.	වජීර අබේවර්ධන මැතිතුමා (ගරු රාජ්‍ය පරිපාලන කටයුතු අමාත්‍ය)	2003	2004
6.	එච්.ජී.අජිත් කුමාර මහතා (ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී)	2004	2007
7.	පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී) ගාල්ල මහ නගර සභාව	2007	2015
8.	රම්‍ය සිරිවංශ මැතිතුමා (විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්)	2015	2016
9.	වන්න දාස්වත්ත මැතිතුමා (වරලත් වෘත්තීමය ගෘහ නිරිමාණ ශිල්පී)	2016	2019
10.	පරාක්‍රම දහනායක මැතිතුමා (නාගරික මන්ත්‍රී, ගාල්ල මහ නගර සභාව)	2020	මේ දක්වා

1.6.5 ගාලු උරුමය පදනමේ ප්‍රධාන විධායක නිලධාරී ධුරය දැරූවන්ගේ තොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	පී .හේවාවසම් මහතා (ගාල්ල ,හිටපු දිසාපති)	2001.12.15	2004.04.01
2.	පී විජේරත්න මහතා (ගාල්ල ,හිටපු අතිරේක දිසාපති)	2004.06.28	2005.12.31
3.	එස්.ඕ.එන්ද සිල්වා මහතා (හිටපු ප්‍රාදේශිය කළමනාකරු ලංකා බැංකුව)	2006.01.12	2007.02.28
4.	එච්.එල්.ගුණවර්ධන මහතා (හිටපු ප්‍රාදේශිය ලේකම්, ගාල්ල කඩවත්සතර)	2007.04.11	2018.04.20
5.	ඩී.කේ.එස්.ජයලක්ෂ්මී මිය (හිටපු ප්‍රාදේශිය ලේකම්, බද්දේගම)	2019.04.29	2020.04.25
6.	සුනිල් දහනායක මහතා (නියෝජ්‍ය ප්‍රධාන ලේකම්, මූල්‍ය කළමනාකරණ දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය)	2020.08.19	මේ දක්වා

1.6.6 ගාලු උරුමය පදනමේ පරිපාලන නිලධාරී තනතුර දැරූ අයගේ තොරතුරු

අනු අංකය	නම	තනතුරට පත්වූ වසර	සේවාව අවසන් කළ වර්ෂය
1.	හේමනාත් ගුණවර්ධන මහතා	2001.03.01	2003.10.31
2.	පී.ඒ.කරුණාසේන මහතා	2004.03.25	2005.12.31
3.	සීතා පී.ලියනගේ මහත්මිය	2006.01.02	2020.09.04

1.7 ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය

ගාලු උරුමය පදනමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනත මගින් "කළමනාකරණ මණ්ඩලය" වෙත පවරනු ලැබ ඇත. (පනතේ 05 වන වගන්තිය පරිදි)

1.7.1 ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් වර්ෂය 2020

නිල බලයෙන් පත් වූ සාමාජිකයින්

අනු අංකය	තනතුර	ලිපිනය
1.	දිස්ත්‍රික් ලේකම් (සභාපති, ගාලු උරුමය පදනම)	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල
2.	පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව)	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07
3.	සභාපති (නාගරික සංවර්ධන අධිකාරිය)	නාගරික සංවර්ධන අධිකාරිය ,07 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල
4.	සභාපති, (ශ්‍රී ලංකා වරාය අධිකාරිය)	ශ්‍රී ලංකා වරාය අධිකාරිය ,අංක 19, පල්ලිය පාර ,කොළඹ 01
5.	අධ්‍යක්ෂ ජනරාල (මධ්‍යම සංස්කෘතික අරමුදල)	මධ්‍යම සංස්කෘතික අරමුදල,අංක 212/1, බෞද්ධාලෝක මාවත ,කොළඹ 07
6.	අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, තැ.පෙ.556, නව මහලේකම් කාර්යාලය,මාලිගාවත්ත පාර, කොළඹ 10
7.	ප්‍රාදේශීය ලේකම් (කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)	කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය , වක්වැල්ල පාර ,ගාල්ල
8.	ගරු නගරාධිපති මහ නගර සභාව	මහ නගර සභාව, කළුවැල්ල පාර ,ගාල්ල .
9.	අධ්‍යක්ෂ , පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, අංක 407, බෞද්ධාලෝක මාවත,කොළඹ 07
10.	සභාපති, ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා)	ජාතික ජලජ සම්පත් ආයතනය (නාරා), කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 07
11.	අංශ ප්‍රධානි, ස්මාරක හා ස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා කිරීම පිළිබඳ අධ්‍යන අංශය (වාස්තු විද්‍යා අධ්‍යයන අංශය)	ස්මාරක හා ස්ථානවල ගෘහ නිර්මාණ ශිල්පය ආරක්ෂා කිරීම පිළිබඳ අධ්‍යන අංශය ,මොරටුව විශ්ව විද්‍යා, (වාස්තු විද්‍යා අධ්‍යයන අංශය),මොරටු විශ්ව විද්‍යාලය ,මොරටුව

12.	දකුණු පළාත් සංස්කෘතික අමාත්‍ය	දක්ෂිණ භාය ,ලබුදූව, ගාල්ල
13.	අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07
14.	සභාපති ,(ශ්‍රී ලංකා නෙදර්ලන්ත විද්‍යාර්ථීන්ගේ සංගමය)	ශ්‍රී ලංකා නෙදර්ලන්ත විද්‍යාර්ථීන්ගේ සංගමය, නො 108, ශ්‍රී විපුලසේන මාවත, කොළඹ 10

අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයන්

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත්වූ දිනය
1.	පරාක්‍රම දහනායක මහතා	සභාපති ගාලු උරුමය පදනම	225, එස්.එච්.දහනායක මාවත,ගාල්ල	2020.01.21
2.	එම්.එස්.චන්ද්‍රසිරි මහතා	පත්කල සාමාජික	ඒ.19, රැම්පාට් විදිය,කොටුව ,ගාල්ල	2019.02.07
3.	බන්දුල නානායක්කාරවසම් මහතා	පත්කල සාමාජික	පොල්හින්දුහේන, කපුගම බටහිර, දෙවුන්දර	2020.01.21
4.	ඇෂ්ලි ඩිවෝස් මහතා	පත්කල සාමාජික	අංක131,ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 02	2020.01.21
5.	නීතිඥ නාලනී අබේවර්ධන මෙනවිය	පත්කල සාමාජික	අංක 03, පල්ලිය හරස් වීදිය, කොටුව, ගාල්ල	2020.01.21
6.	නීතිඥ ලලිත් පතිරණ මහතා	පත්කල සාමාජික	අංක 63, ප්‍රදීපාගාර වීදිය, කොටුව, ගාල්ල	2020.01.21

නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් "තෝරාපත් කරන ලද සාමාජිකයන්"

මෙම සාමාජිකයින්ගේ ධූර කාලය වසර 02කි.

අනු අංකය	නම	තනතුර	ලිපිනය	කළමනාකරණ මණ්ඩලයට පත් වූ දිනය
1.	ජයතිස්ස හේරත් මහතා	සභාපති, ශ්‍රී ලංකා අයිකොමස් ආයතනය	නො 317/3, වෑකන්ද පාර, හබරකඩ, හෝමාගම	2019.07.28
2.	ආචාර්ය නිලාන් කුරේ මහතා	වරලත් වාස්තු විද්‍යාඥ	නො. 111/1, ද මැල් පාර, කටුබැද්ද, මොරටුව	2019.07.28
3.	ආචාර්ය පී.එන්.මීගස්වත්ත මහතා	ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව	ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව , 05වන මහල, ඉසුරුපාය, බත්තරමුල්ල	2019.07.28
4.	නුවන් ජේ. වෙදසිංහ මහතා	නියෝජ්‍ය පොලිස්පති , ගාල්ල දිසාව	නියෝජ්‍ය පොලිස්පති කාර්යාල , කොටුව, ගාල්ල	2020.10.29
5.	දිලේකා කුඩාච්චි මිය	ආණ්ඩුකාර ලේකම්	ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, පහල ඩික්සන් පාර, ගාල්ල	2019.07.28
6.	එච්.ඩබ්.විජේරත්න මහතා	නිටපු සභාපති ,දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව	දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ගාල්ල	2019.07.28

II වන පරිච්ඡේදය

ගාලු උරුමය පදනම විසින් සිදු කරන ලද වැඩසටහන්

ගාලු උරුමය පදනම පිහිට වූ දා සිට මේ දක්වා ගාලු උරුමය පදනමේ සේවාවන් සළකා බැලීමේදී මෑත කාලය තුල කැපී පෙනෙන වෙනසක් සහිත සේවාවන් රැසක් ගාල්ල කොටුව වාසී ජනතාවට ලබා දීමට ගාලු උරුමය පදනමට හැකි වී ඇත.

2.1 ගාලු උරුමය පදනම 2006 සිට 2020 දක්වා සිදු කරන ලද කාර්යයන්

2006 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. 2006.01.24 සහ 25 යන දෙදින පුරා විද්‍යා පොත් ප්‍රදර්ශනය හා සල්පිලක් පැවැත්වීම.

2. මහින්ද චින්තනයට අදාළව " කලා කෙත සහ සංස්කෘතික පෝෂණය " යන තේමාව ඔස්සේ ගාල්ල සමනළ පිටියේදී දකුණේ දුලභ ශාන්ති කර්මයක් වන මහා ගම්මඩු උළෙලක් රැය පහන් වන තුරා පවත්වන ලදී.

3. 2006.04.15 දින හිස තෙල් ගෑමේ උත්සවය පවත්වන ලදී.

4. 2006.09.12 දින ගාල්ල කොටුව ජංගම වෙළඳාමේ යෙදෙන වෙළඳුන් ඒකාරාශී කොටගෙන ඔවුන්ට ගාලු උරුමය පදනම විසින් ලබාදෙන වෙළඳාම් කිරීමේ නීතානුකූල අවසරපත ලබාදීම සඳහා සහ වෙළඳුන්ගේ සුභ සාධන සංගමයක් ගොඩනැගීම සඳහා වන පළමු සභා රැස්වීම ගාලු උරුමය පදනමේ සම්මන්ත්‍රණ ශාලාවේදී ආරම්භ කරන ලදී.

5. 2006.12.04 සිට 2006.12.06 දක්වා ආචාර්ය විලේගොඩ අරියදේව හිමිපාණන් වහන්සේගේ සංකල්පයකට අනුව උන්වහන්සේ විසින් දැවයෙන් නිර්මාණය කරවන ලද සියලු මුද්‍රාවන් දැක්වෙන දැවමය බුද්ධ ප්‍රතිමා සහ තෙල් සායමෙන් කරවන ලද සිතුවම් ඇතුළත් විරල ගණයේ ප්‍රදර්ශණයක් ගාලු උරුමය පදනමේ පූර්ණ අනුග්‍රහයෙන් හා සංවිධානයෙන් ගාල්ල මහ නගර සභා ශාලාවේදී පවත්වන ලදී .ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගාලු උරුමය පදනමේ ආරාධනයෙන් සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ඇතුළුව අමාත්‍යාංශ ලේකම් ප්‍රධානීන් රැසක් සහභාගි විය.

2007 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. ගාලු උරුමය පදනම මඟින් නෙදර්ලන්ත ශ්‍රී ලංකා සංස්කෘතික සහයෝගිතා වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන පුද්ගලික නිවාස සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස 23 වැඩ නිමා කර ඇත.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ මූල්‍ය අනුග්‍රහයෙන් ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ගාලු උරුමය පදනම සංවිධානයෙන් ගාල්ල ඊශ්වර කෝවිලේ දී මහා ශිව රාත්‍රී උත්සවය 2007.02.16 දින පවත්වනු ලැබීය.

3. ශ්‍රී ලංකා ඊජිප්තු අරාබි ජනරජය අතර, ද්වි පාර්ශවීය සම්බන්ධතා ආරම්භ කර අවුරුදු 50ක් සම්පූර්ණ වීම නිමිත්තෙන් සංස්කෘතික අමාත්‍යාංශයේ ආරාධනය මත ශ්‍රී ලංකාවට පැමිණි ඊජිප්තු නර්ථන කණ්ඩායම ගාලු උරුමය පදනමේ සංවිධානයෙන් 2007.07.21 වන දින සංස්කෘතික ප්‍රසංගයක් ගාලු නගර ශාලාවේදි පවත්වන ලදී.

4. ක්‍රිකට් තරඟාවලියට සමඟාමීව විදෙස් සංචාරකයින් ඉලක්ක කොට ලංකා සංචාරක මණ්ඩලය හා වීවා සෙරන්ඩිබ් ආයතනය එක්ව දෙස් විදෙස් සංස්කෘතිකාංග ඇතුළත් සංදර්ශණයක් පැවැත්වීම සඳහා ගාලු උරුමය පදනමෙන් සඳු අට්ටාල භූමි පරිශ්‍රය භාවිතා කිරීමට අනුමැතිය ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම හා එයට අදාල ප්‍රතිපත්ති මාලාව හා ගාස්තු අය කිරීමේ ලේඛණය සකස් කර කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත ගාලු කොටුව සඳු අට්ටාල භූමි පරිශ්‍රය ලබාදීම සිදු කොට ඇත.

5. ක්‍රිකට් තරඟාවලියට සමඟාමීව විදෙස් සංචාරකයින් ඉලක්ක කොට ගාලු කොටුවේ සංවර්ධන අරමුදලට ආධාර පිණිස ගාලු උරුමය පදනම විසින් " ජනරංගන" නමින් දේශීය සම්ප්‍රදායික සංස්කෘතික සංදර්ශනයක් 2007.12.21 වන දින ගාලු උරුමය පදනමේ එළිමහන් රංගභූමි පරිශ්‍රයේදී පවත්වන ලදී.

6. 2007.08.10 ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රිස්තියානි අරමුදලේ දරු දැරියන් 100 ක් සඳහා එම ආයතනයේ ඉල්ලීම පරිදි ගාලු උරුමය පදනම ශාලාවේදී සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී ඒ.කුමුදිනි මිය විසින් "ලෝක උරුම ගාලු කොටුව" පිළිබඳ දේශණයක් පැවැත්වූහ.

8. ගාල්ල කුඹල්වැල්ල සුහද සුහසාධක සංගමයේ සාමාජික සාමාජිකාවන් සඳහා "ලෝක උරුම ගාලු කොටුව" පිළිබඳ දේශණයක් සංස්කෘතික ප්‍රවර්ධන නිලධාරී ඒ.කුමුදුනි මිය විසින් සිදු කරන ලදී.

9. ඵලදායිතා කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ පළමු පියවර වශයෙන් ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තුෂාරි රුවන් පතිරණ මහත්මිය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන සහකාර ඕ .ජී.පී.වන්ද්‍රතිලක මහතා කැඳවීමෙන් ඵලදායිතා සංකල්පය පිළිබඳ ගාලු උරුමය කාර්යාලයේ නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

2008 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. 2008-01-31 ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය අනුර බණ්ඩාරණායක මැතිතුමා වෙනුවෙන් ගාලු කොටුවේ නිළ සංචාරය සංවිධානය කිරීම.

2. 2008-01-20 හික්කඩුව ශ්‍රී සුමංගල නාහිමි ගුණ සමරු වැඩසටහන හික්කඩුව හෙට්ටිගොඩ විහාරස්ථානයේදී පැවැත්වීම.

3. 2008-02-07බාලදක්ෂ මාවතේ පිහිටි ගාලු උරුමය පදනමේ ආපන ශාලාව විවෘත කිරීම.

4. 2008-02-08 සිට 10 දක්වා දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට දායකත්වය ලබාදෙමින් සහභාගී වීම.

5. 2008-03-13 නෙදර්ලන්ත සංස්කෘතික සහයෝගිතා වැඩසටහන යටතේ ගාලු කොටුව තුල ක්‍රියාත්මක වන සංරක්ෂණ ව්‍යාපෘති ඇතුලු ගාලු නගරයේ සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා විශේෂ රැස්වීමක් ඇමතිවරුන් රැසකගේ ප්‍රධානත්වයෙන් දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේදී පැවැත්විනි.

6. 2008-04-08 ප්‍රවීන ගීත නිර්මාණ ශිල්පී ගුණදාස කපුගේ ශූරීන් වෙනුවෙන් සමරු උළෙලක් ගාලු උරුමය පදනම හා කිණිහිර ඇධ්‍යන කවය එක්ව නගර සභා ශාලාවේදී පවත්වන ලදී.

7. යුනෙස්කෝ ආයතනය මගින් ගාලු කොටුවේ ගෝල් හෝට් හෝටලයට විශේෂ ඇගයීම් සම්මානයක් පිරිනැමීමේ උළෙලේදී යුනෙස්කෝ ආසියා පැසිපික් සංස්කෘතික උරුමයන්

සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම වෙනුවෙන් ගාලු උරුමය පදනම යුනෙස්කෝ සම්මානයෙන් පිදුම් ලැබීය.

8. 2008-04-25 සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ එක්කර සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය ලෙස නම් කිරීම .

9. 2008-06-02 ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් යුනෙස්කෝ දකුණු ආසියානු කලාපීය නියෝජිත නිකොල් බිලූම් මෙනවිය ගේ නිරීක්ෂණ චාරිකාව සංවිධානය කිරීම.

10. 2008-07-25 ගාලු කොටුව තුල ක්‍රියාත්මක වූ සංරක්ෂණ ව්‍යාපෘති විවෘත කිරීමේ විශේෂ උත්සවය සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ ගරු අමාත්‍ය මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ඇතුලු මැති ඇමතිවරුන්ගේ සහ නෙදර්ලන්ත තානාපතිතුමා ඇතුලු රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ මූලිකත්වයෙන් පැවැත්වී ය.

11. 2008-08-03 යුනෙස්කෝ නියෝජිත වාස්තු විද්‍යාඥ වයිස් මහතාගේ මූලිකත්වයෙන් ගාලු උරුමය පදනමේ කළමණාකරණ මණ්ඩල සාමාජිකයින් සහ කාර්යාලීය නිලධාරී මණ්ඩලය දැනුවත් කිරීම.

12. 2008-09-02 නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ ප්‍රධාන ලේකම්තුමියගේ මූලිකත්වයෙන් නෙදර්ලන්ත සංස්කෘතික සහයෝගිතා වැඩසටහනේ ව්‍යාපෘතිවල ප්‍රගතිය පරීක්ෂා කිරීම සහ දෙවන අදියර යටතේ යෝජිත ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කිරීමේ රැස්වීමක් පැවැත්වීම.

13. වර්ෂයේ පළාත් ඵලදායිතා සම්මාන උළෙලේ දකුණු පළාතේ අන්තර් දෙපාර්තමේන්තු අංශය යටතේ ගාලු උරුමය පදනම කුසලතා සම්මානයෙන් පිදුම් ලැබීය.

14. 2008-10-11 ගාලු උරුමය පදනම මගින් ඉස්ලාම් බැතිමතුන් වෙනුවෙන් රාමසාන් උත්සවය සංවිධානය කිරීම.

15. 2008-11-30 "දැයේ උරුමය ළමයින්ටයි" තේමාව පාදක කොටගෙන දහම් පාසල් දැනුම් මිනුම් තරගාවලියක් පැවැත්වීම.

16. 2008-12-08 මහාචාර්ය කේ.ඩී. තා ගේ දේශනයෙන් හා ගාලු කොටුවේ ක්ෂේත්‍රපරණවිතාන මහ චාරිකාවක් සමග "ඇයි දිසි ඉමෙන් එහා " වැඩමුළුව ගාලු උරුමය පදනමේ සංවිධානයෙන් ගාල්ල බාල දක්ෂ මාවතේ හෝල් ඩි ගෝල් ශාලාවේදී පවත්වන ලදී.

17. 2008-12- 25 ගාලු සමය වැඩසටහනේදී මහාචාර්ය විනී විතාරන මහතා ගේ හා මහාචාර්ය නිස්ස කාරියවසම් මහතා ගේ දේශනයන්ගෙන් සමන්විත "ජාතික උරුම දිනය" සැමරීම ගාලු උරුමය පදනමේ සංවිධානයෙන් ගාලු නගර ශාලාවේදී පවත්වන ලදී.

2009 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2009 වර්ෂය තුළ ගාලු උරුමය පදනම මඟින් ක්‍රියාත්මක කළ සුවිශේෂී වැඩසටහන් අතර ගාලු කොටුවේ සමාජ ආර්ථික සංස්කෘතික තොරතුරු සමීක්ෂණය කිරීමේ වැඩසටහන විශේෂිත වෙයි. මේ සඳහා නෙදර්ලන්ත ශ්‍රී ලංකා සංස්කෘතික සහයෝගීතා වැඩසටහන යටතේ ප්‍රතිපාදන මත සිදු විය.2009 වර්ෂයේ මාර්තු මාසය පූරාවට මෙම වැඩසටහන ගාල්ල කොටුව තුල ක්‍රියාත්මක වුණි. කළමනාකරණ සැලැස්මට අවශ්ය දත්ත ලබා ගැනීම මෙමගින් සිදු විය. මේ සඳහා රුපියල් ලක්ෂයක මුදලක් වැය විය.

02. කොටුවේ වාස්තු විද්‍යාත්මක වටිනාකම රැඳී තිබූ පැරණි ගොඩනැඟිලි යටතේ තෝරාගත් පැරණි නිවාස 55ක් සංරක්ෂණය කිරීම සිදු විය. මෙම ව්‍යාපෘතියෙහි උපදේශකත්වය හා සංරක්ෂණ සැලසුම් සකස් කිරීම මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා අංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය සමීත මානවඩු මහතා ඇතුළු අධ්‍යයන අංශය විසින් සිදු කරන ලදී. මෙමගින් ගාලු කොටුවට අභිමිව තිබූ වීදි දර්ශනය Street Scape නැවත මතුකර ගැනීමට මෙම ව්‍යාපෘතිය මගින් හැකි වුණි. වෙන් කරනු ලැබූ මුදල රු.මිලියන 48.48කි .

03. ගාලු උරුමය පදනම සඳහා නිල වෙබ් අඩවියක් සකස් කර www.galleheritage.gov.lk නමින් ගාලු උරුමය පදනමේ වෙබ් අඩවිය විවෘත කරනු ලැබීය.

04. ගාල්ල කඩවත්සතර ශාසනාරක්ෂක බල මණ්ඩලයට ඇතුලත් සියලුම දහම් පාසල් වල සිසු දරු දැරියන් ගේ සහභාගිත්වයෙන් ලාංකේය පැරණි සාහිත්‍ය උරුමයන් වූ ගද්‍ය පද්‍ය ග්‍රන්ථ පරිශීලනය කරමින් දැනුම උරගා බැලීම සඳහා පැරණි ගැදි පැදි සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරින් දැනුම මිනුම තරඟාවලියක් 2009.07.29 දින පවත්වන ලදී.

05. ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට ප්‍රබල අඩු පාඩුවක් පැවති ගාල්ල කොටුවේ යටිතල පහසුකම් නොමැති වීමේ ගැටලුවට විසඳුම් වශයෙන් පොදුවැසිකිලි පහසුකම් වැඩිකරමින් ගාලු උරුමය පදනමේ ගරු සභාපති ගාල්ල නාගරික මන්ත්‍රී පරාක්‍රම දහනායක මැතිතුමාගේ විමධ්‍යගත අරමුදල වෙන් ගාල්ල කොටුව සුධර්මාලය පිටිය දසළ ක්ලිපන්බර්ග් මුර අට්ටාලයේ යුධ කාමර සංරක්ෂණය කර පොදු වැසිකළි පද්ධතියක් බවට පත්කරනු ලැබීය.

06. චිනයේ නැංජීං නගරයේ උපත ලැබූ කීර්තිමත් දේශාටකයෙකු වූ චේංහෝ සෙනවියා ලංකාවට පැමිණ අවුරුදු 500ක් පිරීම සිදු විය. එම ගමන සිහිපත් කිරීම සඳහා චීන තනාපති තුමිය 2009.10.30 වන දින ගාල්ල කොටුව නැරඹීමට පැමිණියාය. මෙමගින් නැවතත් චීනයේ නැං ජීං සහ ශ්‍රී ලංකාවේ ගාල්ල අතර සබඳතාව තවදුරටත් තහවුරු විණි.

07. රුහුණු ගුවන් විදුලියේ ආරාධනය මත ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ඇගයීමට ලක්විය යුතු ස්පර්ශනීය හා අස්පර්ශනීය උරුමයන්ගේ වටිනාකම් පිළිබඳ සමාජය දැනුවත් කිරීම සඳහා ගාලු උරුමය නමින් විශේෂ ගුවන් විදුලි වැඩසටහනක් 2009.10.30 වන දින සිට ආරම්භ කරනු ලැබීය.

08. ගාල්ල කොටුව සඳහා සකස් කරනු ලැබූ රථවාහන සැලැස්මේ එක් පියවරක් වූයේ කොටුවේ හඳුනාගත් ප්‍රදේශවල රථගාල් ස්ථාපිත කිරීමය .ඒ අනුව ට්‍රයිටන් මුර අට්ටාලය පිහිටි ප්‍රදේශයේ රථගාලක් ඉදිකරනු ලැබීය . 2009 වර්ෂයේ ගාලු උරුමය පදනමට ලැබුණු ප්‍රාග්ධන මුදල් මෙම ව්‍යාපෘතිය සඳහා භාවිතා කල අතර ගාල්ල කොටුව,සමෘද්ධි බලකාය මගින් මෙහි ඉදිකිරීම් කරනු ලැබීය.

09 ගාලු කොටුවේ පළමු පවුමගෙහි කාණු පද්ධතියක් නිසි ලෙස නොමැතිවීම නිසා වැසි තත්වයන් තුළ විශාල වශයෙන් භූමිය මඩවීම නිසා නිවාස තුලට ජලය ගලායාම කාණු අවහිර වීම දක්නට ලැබුණි .මෙම ගැටලුවට පිළියමක් ලෙසජාතික සවිය ගම නැගුම ව්‍යාපෘතිය යටතේ පරාක්‍රම දහනායක මැතිතුමාගේ මෙහෙයවීමෙන් පළමු පවුමගෙහි කාණු පද්ධති දෙක කොන්ක්‍රීට් දමා සකස් කරනු ලැබීය.

10. යහපත් සනීපාරක්ෂක ක්‍රමවේදයක් පවත්වාගනෙ යාමට ගාලු කොටුවේ මතුපිට කාණු පද්ධතිය නිවැරදිව නඩත්තු කල යුතුව ඇත. වැන්ඩෝ වීදියට සමාන්තරව සුධර්මාලය විහාරය පිටුපසින් ගලා බසිනා මහමේදර බායි ඇළ හෙවත් වැන්ඩෝ වීදියේ කාණුව විශාල වශයෙන් අවහිර වීම නිසා දැඩි මදුරු ගහණයක් මෙම ප්‍රදේශය පුරා පැතිරීමට හේතුවිය. ජාතික සවිය ගම නැගුම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගාලු උරුමය පදනමේ සභාපති, නාගරික මන්ත්‍රී පරාක්‍රම දහනායක මැතිතුමාගේ මෙහෙයවීමෙන් මෙම කාණුව නැවත ශුද්ධ කර කොන්ක්‍රීට් කර සංවර්ධනය කරනු ලැබීය.

11. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් සංවිධානය කල ඵලදායීතා තරගයට 2009 වර්ෂයේදී ගාලු උරුමය පදනම සහභාගි විය. 2009.11.27 වන දින එම ඵලදායීතා තරහයෙන් කුසලතා සම්මානයක් හිමි කර ගැනීමට හැකි විය.

12. ගාලු කොටුව නැරඹීමට සඳහා විශාල පිරිසක් පැමිණෙන අතර ඔවුන්ට අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීමේ කටයුතු ගාලු උරුමය පදනම මගින් සිදුකරනු ලබයි. තරඹන්නන්ගේ පහසුව සඳහා සංචාරකයින් ගාලු කොටුවේ වැඩි වශයෙන් ගැවසෙන ස්ථානවල කසළ බඳුන් 11ක් තැන්පත් කිරීම සඳහා කටයුතු කරනු ලැබීය.

2010 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2010.01.05 සහ 2010.03.07 දිනයන්හි ගාල්ල දිස්ත්‍රික්කයට උරුම වුණු සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් පිළිබඳ සමාජය දැනුවත් කිරීම උදෙසා "ගාලු උරුමය " නමින් විශේෂ ගුවන් විදුලි වැඩසටහන් 25ක් පටිගත කර ගුවන් විදුලි සංස්ථාවේ, රුහුණු ගුවන් විදුලිය හරහා බදාදා රාත්‍රී 7.30 ට ප්‍රචාරය කරනු ලැබීය.

02 ලෝක උරුම ගාලු කොටුව සඳහා රථවාහන කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම.

03. ගාලු කොටුව ව්‍යාපාරික ප්‍රජාව සහ පුරවැසියන් සමඟ එක්ව ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් ගාලු කොටු බැම්ම නඩත්තු කිරීම.

04. 2010.01.10 වන දින දැයේ උරුමය ළමයින්ටයි වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ යක්කලමුල්ල වල්පොල ගෞතමාරාම දහම් පාසලේ සිසු දැරිදැරියන් සඳහා "ලෝක උරුම ගාලු කොටුව" පිළිබඳ දේශනයක් පැවැත්වීම.

05. ලංකාවේ ලෝක උරුම ස්ථානවල උරුම කළමනාකරුවන්ගේ ධාරිතා වර්ධනය කිරීම සඳහා විශේෂ වැඩමුළුවක් ගාලු උරුමය පදනමත් යුනිස්කෝ සංවිධානයත් එක්ව සංවිධානය කරනු ලැබිය. 2010.02.16 සිට 20 දක්වා ක්‍රියාත්මක වූ මෙම නේවාසික වැඩමුළුව පැවැත්වූයේ වක්වැල්ල කළමනකරණ සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථානයේදීය. වැඩමුළුව සඳහා මූල්‍ය දායකත්වය වෙනුවෙන් රු.ලක්ෂ 09ක මුදලක් යුනෙස්කෝ සංවිධානයේ දකුණු ආසියානු පැසිපික් කලාපයේ ලෝක උරුම කාර්යාලය හා " Netherland Trust in Fund" යන ආයතන විසින් ලබා දෙන ලදී. වැඩමුළුව සඳහා ලංකාවේ විවිධ සංස්කෘතික සහ ස්වාභාවික ලෝක උරුම ස්ථානවල කළමනාකරුවන් 37 දෙනෙකු සහභාගි වූහ.සම්පත්දායකයින් ලෙස යුනෙස්කෝ ආයතනයේ නියෝජිතයින් කීපදෙනෙකු සමඟ ලංකාවේ නියෝජිතයින් තිදෙනෙකු සහභාගි විය.මෙහිදී ලෝක උරුම ගාලු කොටුව පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා ගාලු කොටුවේ වාරිකාවක නිරතවීම සහ දකුණු පලාතේ ස්වභාවික උරුමයක් වූ මාදු ගඟ ප්‍රදේශයේ සංචාරයක නිරත වීම සිදු කරන ලදී. වැඩමුළුවේදී ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ දේශන සංවිධානය කරන ලදී.

- ලෝක උරුම ස්ථානයක් ලෙස ගාල්ල කොටුව කේන්ද්‍ර කරගනිමින් උරුම කලමණාකරනයේදී මතුවන ගැටලු සාකච්ඡා කිරීම.
- ගාලු කොටුවේ ගොඩනැගිලි භාවිතය සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම.

06. 2010.02.22 වන දෙස් විදෙස් සංචාරකයින්ට ඓතිහාසික කොටුව වටා මුහුදින් යාත්‍රා කොට එහි අසිරිය විඳ ගැනීමට ගාලු උරුමය පදනම විසින් බෝට්ටු සේවයක් ආරම්භ කිරීමට කටයුතු යොදන ලදී.

07. කොටුව වටා භූමියෙහි තණකොළ කැපීම සහ කොටුව වටා වෙරළ තීරය ශුද්ධ පවිත්‍ර කිරීම.

08. 2010.07.02 ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ආධුනික පොලිස් නිලධාරීන් 300ක පමණ කණ්ඩායමක් වෙත "ලෝක උරුම ස්ථාන" පිළිබඳ දැනුවත් කිරීම.

09. 2010.07.03 දින ලෝඩ්ස්ටා පුද්ගලික ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා "ගාලු කොටුව" පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම.

10. 2010.07.15 වන දින ගාල්ල යක්කලමුල්ල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සාහිත්‍ය දින උත්සවය නිමිත්තෙන් "ගාලු කොටුව " පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම.

11. 2010.06.14 සහ 2010.09.16 දෙදිනයන් හිදී බෝපේ පෝද්දල යොවුන් සේනාංකයේ සිසුන් සඳහා "ගාලු කොටුව " පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්වීම.

12. 2010.08.01 දින ගාල්ල කොටුව රැම්පාට් වීදියේ (පෙඩ්ලර් වීදිය ඉදිරිපිට) පඩිපෙළ සකස් කිරීම.

13. 2010.10.05 වන දින ගාලු කොටුවේ සුධර්මාලය විහාරය ඉදිරිපිට පිටවනියේ සංවර්ධන කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී. මේ මගින් ක්‍රමානුකූලව ජලය බැහැර කිරීම සඳහා කාණු ඉදිකිරීමත්, කොටු බැම්ම මතට රථවාහන ගැනීම වැලැක්වීමට කොන්ක්‍රීට් කුළුණු යෙදීමත් සිදු කරන ලදී.

14. 2010.10.26 වන දින ලංකා බැංකු ප්‍රාදේශිය කාර්යාලය ඉදිරිපිට කොටසෙහි රථගාලක් සහ භූ අලංකරන කටයුතු සිදු කරන ලදී.මේ සඳහා ලංකා බැංකුව මගින් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

15. සුධර්මාලය විහාරය අසළ ක්ලිපන්බර්ග් මුර අට්ටාලය අසල පොදු වැසිකිළිය සකස් කරන ලදී. ගම නැගුම ව්‍යාපෘතිය මගින් මූල්‍ය ප්‍රතිපාදන ලබා දුනි.

16. ගාලු කොටුවේ පළමු පවුමග වීදියේ දෙපස කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. මූල්‍ය ප්‍රතිපාදන ගම නැගුම ව්‍යාපෘතිය මගින් හා ගාලු උරුමය පදනමේ සභාපති නාගරික මන්ත්‍රී පරාක්‍රම දහනායක මහතාගේ විමධ්‍යගත ප්‍රතිපාදන වලිනි.

17. 2010.11.03 වන දින පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ (ගාලු උරුමය පදනම පිහිටි) සංරක්ෂණ කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී.

18. 2010.12.01 වන දින ගාලු කොටුවේ ප්‍රධාන දොරටුව අසල පවතින යුධ ස්මාරකය සංරක්ෂණය කිරීමට කටයුතු යොදන ලදී. මේ සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සංරක්ෂණ අංශය දායකත්වය ලබා දෙන ලදී.

19. ගාලු කොටුවේ පවතින සමාජ විරෝධී ක්‍රියා අවම කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය හා එක්ව ජංගම ආරක්ෂක සේවාවක් 2010.11.04 වන දින ආරම්භ කරන ලදී.

20. ගාලු කොටුවේ කසල කළමණාකරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු විය. එනම් සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණීම නිසාම කොටුවේ පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම උදෙසා විධිමත් කසල කළමණාකරන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය මතුවේ. එහි එක් පියවරක් වශයෙන් කොටුවේ සුදුසු ස්ථානවල ස්ථාපනය කිරීම සඳහා කසල බඳුන් වර්ග 2ක් සකස් කර සවි කිරීමට තීරණය කරනු ලැබීය. ඒ යටතේ සංචාරකයින් විසින් බැහැරලන අපද්‍රව්‍ය එක්රැස් කර ඉවත් කිරීමේ ක්‍රමවේයක් නිර්මාණය කරනු ලැබීය. අනුග්‍රහය ගාලු කොටුවේ ව්‍යාපාරික ප්‍රජාව විසින් දරනු ලැබූ අතර, වැය වූ මුදල රු.135,765.00කි.

21. ලෝක උරුම ස්ථානයක් වශයෙන් ගාලු කොටුවේ පිහිටා ඇති විදි හඳුනාගෙන විධිමත් හැඩයකින් යුත් නාම පුවරු සකස් කර සවි කිරීම අත්‍යවශ්‍ය විය. මීට බලපෑ හේතුව වූයේ විවිධ අමුද්‍රව්‍ය උපයෝගි කරගනිමින් විවිධ හැඩයට සැකසූ පුවරු ගාලු කොටුවේ විදි වල සවිකර තිබූ අතර, මෙම පුවරු කොටුවේ ඉපැරණි වාස්තු විද්‍යාත්මක ආකෘතියට ගැලපෙන බවක් දක්නට නොලැබීය. මෙයට පිළියමක් වශයෙන් කොටුවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට ගැලපෙන පරිදි ෆයිබර් ග්ලාස් භාවිතයෙන් නාම පුවරු 46ක් සකස් කරනු ලැබීය. මේ සඳහා මූල්‍ය දායකත්වය ලබාදෙන ලද්දේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසිනි. මේ සඳහා රු. 395,000.00 ක් වැය විය.

22. ලෝක උරුම ගාලු කොටුවේ, කොටු පවුර නෙදර්ලන්ත රජයේ මූල්‍ය ප්‍රතිපාදන මගින් සංරක්ෂණය කර නිමවූ පසු විධිමත් කළමණාකාරිත්වයකින් නඩත්තු කරගෙනයාම අත්‍යවශ්‍ය විය. නෛතිකමය වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කොටු බැමීමේ නඩත්තු කටයුතු පැවරී තිබුනද මානව සම්පත් සහ උපකරණවල හිහතාවය මත මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ආයතනය දැඩි අපහසුතාවයට පත්ව තිබිණි. මෙයට පිළියමක් ලෙස කළමණාකරණ මණ්ඩල සමාජිකයන්ගේ යෝජනාවක් මත කොටු බැමීමේ නඩත්තු කටයුතු සඳහා කොටුව තුල පිහිටා ඇති ව්‍යාපාරික ආයතනවල සහයෝගය ලබාගැනීමට තීරණය විය. ඒ යටතේ කොටු බැමීම ප්‍රදේශය විවිධ කොටස්වලට බෙදා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා ගාලු උරුමය පදනමේ අධීක්ෂණය මත නඩත්තු කරගෙන යාමට තීරණය විය.

මීට අමතරව වර්ෂයට දෙවරක් ශ්‍රමදාන වැඩපිළිවෙලක් පැවැත්වීම ගාලු උරුමය පදනමෙන් සිදු කරයි.

2011 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2011.02.04 සිට 10 දක්වා දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගි වීම. මේ සඳහා ගාලු උරුමය පදනම විසින් කොටුවේ ආකෘතිය සහිත ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කරනු ලැබීය. වැය කළ මුදල රු. 197,996.00 කි. ප්‍රතිපාදන සපයන ලද්දේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙනි.

02. 2011 පෙබරවාරි 27 ගාලු කොටුව නැරඹීමට නෙදර්ලන්තයෙන් පැමිණි විශ්‍රාමික රාජ්‍ය සේවකයන් පිරිසකට ගාලු කොටුව පිළිබඳව "Dutch Heritage in Galle City" මාතෘකාවෙන් ගාලු උරුමය පදනම මගින් දේශනයක් ලබා දෙන ලදි.

03. 2011.04.16 වන දින සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් බක්මහේ හිසතෙල් ගෑමේ මහෝත්සවය ගාල්ල කොටුව උසාවි චතුරස්‍රය ඉදිරිපිට පවත්වන ලදී.

04. 2011 මාර්තු 29 මහින්ද චින්තනයේ ඉදිරි දැක්ම යටතේ ක්‍රියාත්මක වන දිවි නැගුම වැඩසටහන ගාලු කොටුවේ ක්‍රියාත්මක කිරීමට ගාලු උරුමය පදනම විසින් කටයුතු යොදන ලදි.

05. 2011-04-28 ගාලු කොටුවේ කසළ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් ස්ථාන කිහිපයක කසළ බඳුන් ස්ථාපිත කිරීමට කටයුතු යොදන ලදී. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.159,000.00කි.

06. 2011.05.23 ගාලු කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අයත් දහම් පාසල් 56ක් අතර දැනුම් මිනුම් තරගයක් පවත්වා එහි ජයග්‍රාහක සිසුන්ට ත්‍යාග හා සහතිකපත්‍ර බෙදා දීම සිදු කරන ලදී.

07. 2011.06.03 ගාලු කොටුවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ට ගාලු කොටුව පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා සිතියම් 02ක් ගාලු කොටුවට පිවිසෙන ප්‍රධාන දොරටු දෙකෙහි ස්ථාපනය කිරීමට කටයුතු යොදන ලදී. ගාලු කොටුවේ ගෝල් ෆෝර්ට් හෝටලය මගින් මෙම සිතියම් නිර්මාණය කිරීම වෙනුවෙන් ෆයිබර් ටෙක් ආයතනට රු.260,000.00 ක් ලබා දෙමින් අනුග්‍රහය දක්වන ලදි. ගාලු උරුමය පදනම දැරීමට සිදු වූයේ රු.2880.00ක මුදලකි

08. 2011.06.16 ගාලු කොටුවේ සමාජ විරෝධී ක්‍රියා අවම කිරීමටත් දෙස් විදෙස් සංචාරකයින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම සඳහාත් ගාලු කොටුවේ ඊ-කෝට්ස් ගොඩනැගිල්ලේ පොලිස් මුර පොළක් ස්ථාපිත කරන ලදී. වැය කල මුදල රු.177,109.25 කි.

09. 2011 ජුනි මස ගාලු කොටුවේ ශ්‍රී සුධර්මාලය විහාරය ඉදිරිපිට පිට්ටනියේ දෙවන අදියරෙහි සංවර්ධන කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී. මේ මඟින් ක්‍රමානුකූලව ජලය බැහැර වීම සඳහා සඳහා කාණු ඉදිකිරීමත්, කොටු බැම්ම මතට රථවාහන ගැනීම වැලැක්වීමටත් කොන්ක්‍රීට් කුළුණු යෙදීම සිදු කරන ලදී. වැය කල මුදල රු. 15,33,889.89 කි.

10. 2011.06.20 ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත්වීම මත ගාලු කොටුවේ මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම මත මෙය සිදු කරනු ලබන අතර, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලදී. මෙහි සම්බන්ධීකරණ කටයුතු ගාලු උරුමය පදනම මගින් සිදු කරනු ලැබීය.

11. 2011.06.25 ගාල්ල කොටුවේ පිහිටි ගොඩනැගිලි ඡායාරූප ගත කිරීමේ වැඩපිළිවෙළ මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා අංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම ආරම්භ විය. මෙහි වැය කරන ලද මුදල රු. 30,000.00කි.

12. 2011.06.29 පැරණි කච්චේරි ගොඩනැගිල්ලේ කඩා වැටුණු කොටස සංරක්ෂණය කිරීම ආරම්භ විය. (2009.11.16 වන දින කොටසක් කඩා වැටුණි.) එහි පළමු අදියර යටතේ සංරක්ෂණ කටයුතු සිදු කල අතර, දෙවන අදියර යටතේ එහි පිපිරීම් වලට ලක්වූ කොටස සංරක්ෂණ කිරීම සිදු විය. වැය කල මුදල රු. 14,44,159.23 වේ.

13. 2011.07.03 සංචාරක පුරවරයක් ලෙස ගාලු කොටුව ප්‍රවර්ධනය කිරීම සඳහා ගාලු කොටුවේ තණකොළ කැපීම හා කොටු බැම්මේ වල් පැල ගැලවීම ආරම්භ කරන ලදී.

14. 2011.07.15 ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානයේ අලෙවි කිරීම සඳහා ගාල්ල කොටුවේ තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා මුද්‍රණය කරන ලදී.රු. 325,199.50 ක මුදලක් මේ සඳහා වැය කරන ලදී.

15. 2011.07.25 ගාලු කොටුවේ පැරණි යුධ කාමර සංරක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති සැකසීමට මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා අධ්‍යයන අංශයට භාරදෙන ලදී.

16. 2011.07.29 පැරණි කච්චේරිය පිටුපස තිබූ ගරාවැටුණු ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම ඉවත් කොට භූ සැකසුම් කර භූමිය අලංකරණය කරන ලදී. මේ සඳහා වැය කරන ලද මුදල රු. 5,28,979.02කි.

17. 2011 ජූලි මස ගාලු කොටුවේ රෝහල වීදියෙහි ලංකා බැංකුව ප්‍රාදේශීය කාර්යාලය ඉදිරිපස භූ අලංකරණය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කල අතර, අධීක්ෂණ කටයුතු හා සංවිධාන කටයුතු ගාලු උරුමය පදනම විසින් සිදු කරන ලදී. මේ සඳහා ලංකා බැංකුව මගින් ප්‍රතිපාදන ලබාදුන් අතර, එහි වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම නිම කර ඇත.

18. 2011 ජූලි මස ගාලු කොටුවේ රැම්පාට් වීදියෙහි නෙප්චූන් මුර අට්ටාලය සහ ට්‍රයිටන් මුර අට්ටාලය අතර ඇති කොටු බැම්මට ප්‍රවේශ වන පඩිපෙළ සංරක්ෂණය කිරීම සිදු කරන ලදී. වැය කරන ලද මුදල රු. 34,512.85කි.

19. 2011.08.15 ගාලු කොටුවෙහි ආකෘතියක් සෑදීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ වාස්තු විද්‍යා අධ්‍යයන අංශයට භාර දෙන ලදී. මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල රු. 350,000.00 වන අතර, වැය කරන ලද මුදල රු.140,000.00කි. ප්‍රතිපාදන සපයන ලද්දේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයෙනි.

20. 2011.09.07 ගාලු උරුමය පදනම මගින් ගාලු කොටුවේ තණකොළ කැපීමේ කටයුතු නැවත ආරම්භ කිරීම.

21. 2011.09.08 සහ 09 ගාලු කොටුවේ ඇති ඉපැරණි ගස් වර්ග හඳුනා ගැනීම සහ ඒවා නම් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සහය දක්වන ලෙස ගාලු උරුමය පදනම මගින් පේරාදෙණිය උද්භිත විද්‍යා අංශයට කර තිබූ ඉල්ලීම පරිදි එම අංශයේ සහභාගිත්වයෙන් මෙය ආරම්භ කරනු ලැබිය. ඉදිරියේදී කොටුවේ ගස් හඳුනා ගැනීම සහ නාමකරණය කිරීම සිදු කරනු ඇත.

22. 2011.09.20 ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂවේදී උපාධි අපේක්ෂක සිසුන් කණ්ඩායමක් සඳහා ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති නිලධාරී තරංග ආරච්චි මහතා විසින් ලෝක උරුමය පිළිබඳ දේශනයක් පවත්වන ලදී.

23. 2011.10.15 පොලිස් අභ්‍යාස විද්‍යාලයට දේශනයක් පැවැත්වීම.

24. 2011.10.25 ඇමරිකානු නානාපතිනිය කොටුවට පැමිණීම.

25. 2011.11.20 ගාල්ල කළුවැල්ල විහාරස්ථානයේදී දහම්පාසල් තරඟය පැවැත්වීම සඳහා ගාලු උරුමය පදනමේ දායකත්වය ලබා දෙන ලදී.

26. 2011.12.07 වන දින ගරු ආණ්ඩුකාරතුමියගේ ප්‍රධානත්වයෙන් ගාලු කොටුව සඳහා කසළ බඳුන් ලබා දීමේ වැඩසටහනක් ගාලු කොටුව සමුද්‍ර පුරා විද්‍යා කෞතුකාගාරයේදී පවත්වන ලදී.

2012 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2012.01.05 මාතර, හක්මන, නරාවැල්පිට පදිංචි එන්සිහාමි මාතාව විසින් අවුරුදු 70-75 ක් අතර කාලයකට ඉහතදී වියන ලද පෝරු කවියක් සහිත දුර්ලභ කලාත්මක වටිනාකමකින් හෙබි පන් පැදුර ගාලු උරුමය පදනමේ මැදිහත්වීම සහ මගපෙන්වීම මත කොළඹ ජාතික කෞතුකාගාරයට භාර දීම සිදු විය. එමගින් වටිනා කලාත්මක සම්පතක් ආරක්ෂා කර ගැනීමට මෙන්ම ජාතියට දායාද කරලීමටද හැකිවිය.

02. 2012.01.15 තෛපොංගල් උත්සවය වෙනුවෙන් ගාල්ල කළුවැල්ල පාරේ පිහිටි කදිර් වේලායුධ කෝවිලේ ගාලු උරුමය පදනමේ අනුග්‍රහයෙන් විශේෂ දේව පූජා පැවැත්වූ අතර එහි මුඛ්‍ය පරමාර්ථය වූයේ ජාතීන් අතර ඇති සමගිය සහජීවනය වර්ධනය කරලීමයි.

03. 2012.01.17 ගාලු කොටුවේ වීදි ආලෝකකරණය කිරීම සඳහා ගාලු උරුමය පදනම මගින් විදුලි පහන් සවි කිරීම සිදුකල අතර එමගින් ගාලු කොටුවේ වීදිවල රාත්‍රී කාලයේ පැහිර තිබූ අඳුර මකාලීම සිදු කල හැකිවිය. ආලෝකකරණ පද්ධති සවි කිරීම තුලින් මහජනයාට වඩාත් පහසුදායි පරිසරයක් මෙන්ම ගාලු කොටුව අලංකරණය කිරීමටද හැකි විය.

04. 2012.02.01 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ප්‍රදේශයේ පැවැත්වූ 06 වන දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටි ජාලය සමඟ ගාලු උරුමය පදනම විසින් විශේෂිත ප්‍රදර්ශන කුටියක් සහ දැනුවත් කරලීමේ වැඩසටහනක් සිදුකරන ලදී. 2012.02.04 දින සිට 2012.02.12 දින දක්වා ප්‍රදර්ශනයට සම්බන්ධ වෙමින් ජනතාව දැනුවත් කරලීමේ ජාතික මෙහෙවර ඉටුකරන ලදී

05. 2012.02.14 සාර්ක් රටවල සංස්කෘතින් සහ සහයෝගිතාවය වර්ධනය කර ගැනීම සඳහා සඳහා කලා හැකියාවන් හුවමාරු කර ගැනීමේ අරමුණ ඇතිව සාර්ක් රටවල නියෝජිත පිරිසක් ගාලු කොටුවට පැමිණි අතර සාර්ක් රටවල සංස්කෘතික අංග ඇතුලත් සංස්කෘතික ප්‍රදර්ශනයක් උසාවි චතුරස්‍රයේදී පවත්වන ලදී.

06. 2012.03.09 ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ආරාධනාවක් අනුව එම විද්‍යාලයේ පුහුණුවන නිලධාරින් සඳහා "ජාතික උරුමයන් සහ ලංකාවේ ලෝක උරුමයන්" දේශනයක් පවත්වන ලදී.

07. DSI සමූහ ව්‍යාපාරය සහ එහි සේවකයන් ගාලු උරුමය පදනමේ මහපෙන්වීම අනුව ගාලු කොටුව භූමි පරිශ්‍රය පිරිසිදු කරලීමේ ශ්‍රමදාන වැඩසටහනක් සිදුකල අතර එමගින් ගාලු කොටුව ප්‍රදේශය සෞඛ්‍ය ආරක්ෂිත ප්‍රදේශයක් බවට පත්කරලීමට මෙන්ම එම ආයතනයේ සේවකයන් හට ගාලු කොටුවේ පවතින ඓතිහාසික වටිනාකම් පිළිබඳ දැනුවත් කරලීමට ද හැකිවීය.

08. 2012.03.14 ආණ්ඩුකාර ලේකම් කාර්යාලය මගින් සංවිධානය කළ "ගසල්" වාදනයන් සහිත ඉන්දීය ගසල් වාද්‍ය ශිල්පීය විසින් ඉදිරිපත් කල "කථක්" ප්‍රසංගයක් හෝල්ඩ් ගෝල් හිදී පවත්වන ලදී.

09. 2012.03.23 දෙස් විදෙස් සංචාරකයන්ගේ අවධානය දිනාගන්නා ස්ථානයක් වන ගාල්ල කොටුව ප්‍රදීපාගාරය අසළ වෙරළ තීරය සංවර්ධනය කරලීමේ අරමුණ ඇතිව "එක් ගමකට එක් වැඩක්" යන වැඩසටහන යටතේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දියනෑම සඳහා සහ ඇඳුම් මාරු කරලීමට අප ආයතනයේ සම්බන්ධීකරණය ඇතිව මුල්ගල තැබීම සිදු විය.

10. 2012.04.15 සිංහල දමිල අළුත් අවුරුදු වාරිත්‍ර ඉටුකිරීම වෙනුවෙන් ගාලු උරුමය පදනම මගින් හිසතෙල් ගෑමේ මහෝත්සවයක් ගාලු කොටුව උසාවි චතුරස්‍රයේදී පැවැත්වූ අතර ආරාධිත අමුත්තන්ගේද සහභාගිත්වයෙන් පෙ.ව. 7.08 යෙදුනු සුභ මොහොතින් එම වාරිත්‍ර ඉටුකිරීම සිදු විය.

11. 2012.04.23 රාජ්‍ය සේවයට බදවාගත් උපාධිධාරි අභ්‍යාසලාභීන් වෙනුවෙන් කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම අනුව ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සැලසුම් නිලධාරි තරංග මහතා විසින් උරුමයන් පිළිබඳව විශේෂිත දේශනයක් සහ ගාලු කොටුවේ දේශනයක් සිදු කරන ලදී.

12. 2012.04.29 ඕස්ට්‍රියා විදේශ සම්බන්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමන් සහ එරට තානාපතිතුමන්ගේ ගාලු කොටුව නැරඹීම සඳහා වන සංචාරය සිදු වූ අතර මාර්ගෝපදේශන සේවා සපයනු ලැබුවේ ගාලු උරුමය පදනම විසිනි.

13. 2012.05.18 චීන සමූහාන්ඩුව රාජ්‍ය නියෝජිත පිරිසක් ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරිකාවකට පැමිණි අතර ගාලු උරුමය පදනම මගින් ඒ සඳහා පහසුකම් සපයනු ලැබේ.

14. 2012.05.20 "දැයේ උරුමය දරුවන්ටයි" යන තේමාව යටතේ ගාලු උරුමය පදනම සංවිධානය කල දහම් දැනුම මිනුම් තරඟය ජයග්‍රහනය කළ දහම් පාසල් දරු දැරියන් සඳහා ත්‍යාග ප්‍රධානෝත්සවය ගාල්ල දිස්ත්‍රික් ලේකම් රවීන්ද්‍ර හේවාවිතාරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගාලු උරුමය පදනමේ කාර්යාලයේදී සිදු කෙරිනි.

15. 2012.06.01 කළුතර කටුකුරුන්ද පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ලබන නිලධාරීන් සඳහා "ජාතික උරුමයන් සහ ලෝක උරුමයන්" යන මැයෙන් දේශනයක් ගාලු උරුමය පදනමේ ව්‍යාපෘති සැලසුම් නිලධාරි තරංග මහතා විසින් සිදු කරන ලදී.

16. 2012.06.17 ගාලු උරුමය පදනම සහ ඉන්දීය රජය සමඟ සිදු කිරීමට යෝජිත ඉන්දීය සංස්කෘතික ගැලරිය සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඉන්දීය මහකොමසාරිස්තුමා ගාලු උරුමය පදනම වෙත පැමිණි අතර යෝජිත ව්‍යාපෘතිය සිදු කිරීමට අදාල තීරණ එහිදී ගනු ලැබීය.

17. 2012.07.27 ගාල්ල මහ නගර සභාව සහ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ප්‍රජා විශෝධන අඥාලාභින් යොදවා ගාලු උරුමය පදනමේ මහපෙන්වීම යටතේ ඩෙංගු මර්ධනය කිරීමේ වැඩසටහනක් ලෙස ශ්‍රමදානයක් පැවැත්වීය.

18. 2012.07.28, 29 ගාලු කොටුවේ පිහිටි හඳුනාගත් ගස්වල අනාරක්ෂිත අතු සහ ශාඛා කොටස් ඉවත් කිරීම සිදු කරන ලදී. ඒ තුලින් ගාලු කොටු පරිශ්‍රය ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස පවත්වා ගැනීමට මෙන්ම අලංකාරත්වය පවත්වා ගැනීමට හැකියාව ලැබිණ.

19. 2012.08.13 අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය සඳහා හෝල් දී ගෝල් ශාලාවට පැමිණි අතර එය සුවිශේෂී දිනයක් විය. එම රැස්වීම සඳහා සභාපතිතුමන් සහභාගි විය.

20. 2012.08.14 දින 2012 වසරේ ඵලදායි සම්මාන උළෙල සඳහා ජාතික ඵලදායි ලේකම් කාර්යාලය මඟින් සිදුකරනු ලබන ආයතන පරික්ෂාව සිදු වූ අතර 2011 වසරේ D_2 කාණ්ඩය යටතේ රාජ්‍ය අංශයේ ක්ෂුද්‍ර පරිමාණ ආයතන මට්ටමින් ඵලදායි වීමේ විභවතාවයන් ඇති ආයතනයක් ලෙස ස්ථානයක් දිනා ගැනීමට ගාලු උරුමය පදනමට හැකි විය.

21. 2012.09.01 චීන රාජ්‍ය තාන්ත්‍රික පිරිසක් නිල සංචාරයක් සඳහා ගාලු කොටුවට පැමිණි අතර එය සම්බන්ධීකරණය කිරීම සහ මාර්ගෝපදේශනය ගාලු උරුමය පදනම මගින් සිදු කරන ලදී.

22. 2012.09.13 58වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය දූත පිරිසක් කොටුවේ සංචාරය සඳහා පැමිණි අතර එහි සම්බන්ධීකරණය කිරීම සහ මාර්ගෝපදේශනය ගාලු උරුමය පදනම මගින් සිදු කරන ලදී.

23. 2012.11.14 ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සහ ඇමරිකානු රජයේ මැදිහත්වීම මත සිදු කරනු ලබන ගාලු කොටුවේ පැරණි ගොඩනැගිලි 150ක සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය විමසා බැලීම සඳහා ඇමරිකානු තානාපතිනිය ගාලු උරුමය පදනම වෙත පැමිණීම සිදු විය.

24. 2012.11.18 "දැයේ උරුම දරුවන්ටයි" තේමාව යටතේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් දරු දැරියන් උදෙසා දහම් දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් ගාල්ල, කළුවැල්ල,බෞද්ධ මධ්‍යස්ථාන විහාරස්ථානයේදී ගාලු උරුමය පදනමේ මෙහෙයවීමෙන් පැවැත්විනි.

25. 2012.12.03 ගාලු උරුමය පදනමේ කාර්යාලය පිහිටි කච්චේරි ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින් පවරා ගැනීම හේතුවෙන් ගාලු උරුමය පදනමේ කාර්යාලය ගාල්ල, කළුවැල්ල පාරේ, අංක 212/1/1 පිහිටි ගොඩනැල්ලක් වෙත රැගෙන ඒමට සිදු විය.

26. 2012.12.26 ඕස්ට්‍රේලියානු අගමැතිතුමාගේ ගාලු කොටුවේ සංචාරය සිදු වූ අතර ගාලු උරුමය පදනම ඒ සඳහා පහසුකම් සපයනු ලැබීය.

27. 2012.12.16 දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගැනීම සඳහා දෙස් විදෙස් ව්‍යාපාරිකයන්ගේ සම්බන්ධ වීමෙන් "ගාලු නිදහස් වෙළඳ පොළ" ප්‍රථම වරට ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් කොටුව උසාවි චතුරස්‍රයේදී සාර්ථකව පැවැත්විණි. එය මාසිකව ඉදිරියට සිදු කිරීමටද යෝජිතය.

2013 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01 2013.02.01 ඓතිහාසික සංස්කෘතික නගර මධ්‍යස්ථානයක් හා පුරාවිද්‍යාත්මක වැදගත්කමක් ඇති ප්‍රදේශයක් ලෙස ගාලු කොටුව සංරක්ෂණය කිරීම හා සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ මෙහෙවර ප්‍රකාශය සාක්ෂාත් කරමින් ගාලු කොටුවේ සියළුම තැන් ආවරණය කරමින් යුධහමුදාව හා නගර සභාවේ සහය ඇතිව ශ්‍රමදානයක් සංවිධානය කිරීම.

02. බංගලාදේශ පරිපාලන සේවයේ නිලධාරින් කණ්ඩායමක් කොටුවේ සංචාරය කිරීමේදී ඔවුන්ට ඓතිහාසික ගාලු කොටුවේ වටිනාකම පිළිබඳව දැනුවත් කිරීමක් ගාලු උරුමය පදනම විසින් සිදු කරන ලදී.

03. කොරියානු රජයේ නිලධාරින් කණ්ඩායමක් ගාලු කොටුවේ සංචාරය කිරීමේදි ඔවුන්ට ඓතිහාසික ගාලු කොටුවේ වටිනාකම පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කරන ලදී.

04. 2013.03.15 කොළඹ ආනන්ද විදුහලේ 10 හා 8 ශ්‍රේණියේ ඉගෙනුම් ලබන සිසු දරුවන් වෙනුවෙන් ගාලු උරුමය පදනම විසින් ගාලු කොටුවේ නිබෙන්නා වූ ඓතිහාසික වැදගත්කම හා එහි වටිනාකම් පිළිබඳ කණ්ඩායම් වෙන්කර දේශන පැවැත්වීම හා ගාලු කොටුවේ ක්ෂේත්‍ර වාරිකාවක් සංවිධානය කරන ලදී.

05. 2013.03.18 "ඇසි දිසි ඉමෙන් එහා" වැඩසටහන යටතේ රාජ්‍ය නිලධාරින්ට ඓතිහාසික ගාලු කොටුව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

06. 2013.03.23 "අසිරිමත් සාමයෙන් ඉසුරුමත් හෙටක්" යන තේමාව යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ 07වන වරටත් අභිමානයෙන් ඉදිරිපත් කළ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයේ ප්‍රදර්ශන කුටි ජාලය සමඟ එක්ව ගාලු උරුමය පදනම විසින් විශේෂිත ප්‍රදර්ශන කුටියක් සාදා ලෝක උරුම ගාලු කොටුවේ අභිමානය විදහා දක්වන ලදී. ඒ අතර ජනතාව දැනුවත් කිරීමේ දායකත්වය දෙමින් 2013.03.23 දින සිට 2013.03.31 දක්වා සහභාගි වන ලදී.

07. 2013.03.27 ඉන්දීය පරිපාලන සේවයේ නිලධාරීන් පිරිසක් සඳහා කොටුව පිළිබඳ දැනුවත් කිරීමක් හා ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීම.

08. 2013.04.15 සිංහල හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් හිසතෙල් ගෑමේ මහෝත්සවයක් ගාල්ල කොටුව සුධර්මාලය විහාරස්ථානයේදී සිදු කිරීම.

09. 2013.04.27 පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමඟ එක්ව පුනුරුත්ථාපනය වන අභ්‍යාසලාභීන් 375ක් සඳහා කොටුවේ ඓතිහාසික වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීමක් සහ ක්ෂේත්‍ර චාරිකාවක නිරත වීම.

10. හපුගල ඉංජිනේරු පීඨයේ සිසුන් විසින් ගාලු උරුමය පදනමේ මහපෙන්වීම අනුව ගාලු කොටුව භූමි පරිශ්‍රයේ ශ්‍රමදාන වැඩසටහනක් සිදු කල අතර එහි අරමුණ වූයේ ලෝක උරුම ගාලු කොටුවේ සුන්දරත්වය ඒ අයුරින්ම පවත්වා ගැනීමය.

11. 2013.06.02 ගාලු උරුමය සංවිධානය කල "දැයේ උරුමය දරුවන්ටයි" දහම් දැනුම මිනුම තරඟය ජයග්‍රහනය කල දහම් පාසල් දරුවන්ට ත්‍යාග හා සහතික ලබා දීම සිදු විය.

12. 2013.06.28 කුරුණෑගල සෙන්ට්ස් ඇන්ස් විදුහලේ සිසුන් 127 හා ගුරුවරුන් 08ක් වෙත මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

13. 2013.07.05 නික/ ඉසිපතන මධ්‍ය මහා විදුහල සහ නික/ මහසෙන් මහ විදුහලේ සිසුන් 61 සහ ගුරුවරු 05ක් සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

14. 2013.07.12 මාර/පනාදුරේ කන්ෂ්ඨ විදුහලේ සිසුන් 192ක් සහ ගුරුවරු 15ක් සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

15. 2013.07.29 කු/නිකවැරටිය මහසෙන් විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 30ක් සහ ගුරුවරු 05ක් සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

16. 2013.08.06 මාර/ කනංකේ කණිෂ්ඨ විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 102ක් සහ ගුරුවරු 06 දෙනෙක් සඳහා මාර්ගෝපදේශකත්වය ලබා දෙන ලදී.

17. 2013.08.25 දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශනය දිනාගත් "ගාලු නිදහස් වෙළඳ පොළ" අති සාර්ථක ලෙස ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් කොටුව උසාවි චතුරස්‍රයේදී පවත්වන ලදී.

18. 2013.08.27 ශ්‍රී ලංකාවේ නෙදර්ලන්ත විද්‍යාර්ථයින්ගේ සංගමය (NAAL) ආයතනයේ මූල්‍යමය සහයෝගය ඇතිව මොරටුව විශ්ව විද්‍යාලයේ උපදේශකත්වයෙන් ගාල්ල කොටුවේ පෙඩ්ලර් වීදියේ අංක 40 දරණ නිවස සංරක්ෂණය කිරීමට ගාලු උරුමය පදනම සහයෝගය ලබා දෙන ලදී.

19. 2013.09.16 ගාල්ල කොටුව ජංගම වෙළඳ සංගමය විසින් ගාලු උරුමයේ සහයෝගය ඇත්ව කොටුවේ සුන්දරත්වය ඒ අයුරින්ම ඉදිරියටත් පවත්වාගෙන යාමේ අරමුණ ඇතිව ගාලු කොටුව භූමි පරිශ්‍රය පිරිසිදු කරලීමේ ශ්‍රමදාන වැඩසටහනක් සිදු කරන ලදී.

20. HNDE බදුල්ල,ගාල්ල, මහනුවර, දෙහිවල යන ශාඛාවන්හි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 300ක් සඳහා සහ පුනරුත්ථාපන කටයුතු අමාත්‍යාංශයේ නිටපු නියෝජ්‍ය ලේකම්කම්තුමා ඇතුළු පිරිස වෙත මාර්ගෝපදේශන සේවාව ලබා දෙන ලදී.

21. 2013.10.01 දින ගා/කහදූව මහා විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 55ක් සහ ගුරුවරු 03ක් සඳහා ගාලු කොටුව පිළිබඳ මාර්ගෝපදේශකත්වය සපයන ලදී.

22. ගාල්ල අමරසූරිය ගුරු විද්‍යාලයේ ගුරු මහත්ම මහත්මීන් සඳහා මාර්ගෝපදේශක සේවාව සපයන ලදී.

23. 2013.11.10 පොදු රාජ්‍ය මණ්ඩලීය ජනතා සමුළුවට සමගාමීවව ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ ජනතා සංසදය සඳහා කොටුව පරිශ්‍රය තණකොළ කපා කොටු බැම්ම විදුලි බුබුළු දමා ආලෝකමත් කිරීමට කටයුතු කිරීම.

24. 2013.11.16 දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ශනය දිනාගත් "ගාලු නිදහස් වෙළඳ පොළ" 5 වෙනි වතාවටත් පොදු රාජ්‍ය මණ්ඩලීය ජනතා සමුළුවට සමගාමීව අති සාර්ථක ලෙස කොටුව උසාවි චතුරශ්‍රයේ දී පැවැත්විය.

25. 2013.11.19 නුගේගොඩ ජාත්‍යන්තර පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 101ක් සහ ගුරුවරු 07ක් සඳහා ගාලු කොටුව පිළිබඳ මාර්ගෝපදේශකත්වය සපයන ලදී.

26. 2013.11.28 හපුගල ඉංජිනේරු පීඨය සමග ඒකාබද්ධව ගාලු කොටුවේ දත්ත ඇතුලත් කර සකස් කරනු ලැබූ අන්තර් ක්‍රියාකාරී විද්‍යුත් සිතියම (Interactive Digital Map Project) ක්‍රියාකර වීම සිදු විය.

27. 2013.12.01 "දැයේ උරුමය දරුවන්ටයි" තේමාව යටතේ ගාල්ල කඩවත්සතර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ දහම් පාසල් දරු දැරියන් සඳහා දහම් දැනුම පිළිබඳ ලිඛිත පරීක්ෂණයක් ගාල්ල, කළුවැල්ල බෞද්ධ මධ්‍යස්ථානයේ දී ගාලු උරුමය පදනමේ මෙහෙය වීමෙන් පැවැත්විනි.

28. 2013.12.24 ට්‍රයිටන් යුධ කාමරය සංරක්ෂණය කර දේශීය අත්කම් භාණ්ඩ වෙළඳ පොළක් විවෘත කිරීම සිදු විය.

29. 2013.12.28, 29,30,31 ගාලු කොටුවේ සුධර්මාලය භූමි පරිශ්‍රයේ පවත්වන ලද "ගාලු අසිරිය " වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය වෙනුවෙන් ගාලු උරුමය පදනමෙන්ද විශේෂ ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී.

30. ගාලු කොටු බැමීමේ පහළ කොටසේ විදුලි ලාම්පු 50ක් සවි කිරීම.

31. උසාවි චතුරස්‍රයේ වටා විදුලි ලාම්පු 8ක් අළුත්වැඩියා කිරීම සහ පැරණි අම්බලමේ විදුලි ලාම්පු අළුත්වැඩියා කිරීම.

32. බාලදක්ෂ මාවතේ පිහිටි ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානය සඳහා ලබා දී ඇති ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම.

33. ගාලු කොටුවේ විදී නාම පුවරු සවි කිරීම.

34. කොටුව සුධර්මාල විහාරය අසළ පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීම.

35. ප්‍රදීපාගාරය අසළ වෙරළට බැසීමට ඇති පඩි පෙළ සකස් කිරීම.

36. සංචාරක බෝට්ටු සේවාව පැවැත්වීම වෙනුවෙන් ජැටිය සංවර්ධනය කිරීම.

2014 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2014.01.25 ගාලු උරුමය පදනමේ සහයෝගය ඇතිව උසාවි චතුරස්‍රයේ ගාලු පොළ පැවැත්වීම.

02. 2014.02.03,04 නිදහස් දිනය නිමිත්තෙන් ගාලු කොටු පවුර ආලෝකයෙන් සැරසීම.

03. 2014.02.20 සිට 03.02 දක්වා කුරුණෑගල දැයට කිරුළ ප්‍රදර්ශන කුටිය සඳහාද අප ආයතනය මගින් ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කිරීම.

04. 2014.04.16 සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් ගාලු උරුමය පදනම මගින් වාර්ෂිකව සංවිධානය කරන හිසතෙල් ගෑමේ මහෝත්සවය සහ සංස්කෘතික සංදර්ශනය විශාල මහජන සහභාගිත්වයෙන් උසාවි චතුරස්‍රයේදී පැවැත්විණ.

05. 2014.05.05 IORA වැඩසටහන යටතේ UNESCO වැඩමුළුව සඳහා ලංකාවට පැමිණි නිලධාරීන් ගාල්ල කොටුවේ සංචාරය කිරීම මේ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

06. 2014.07.20 රුහුණු විශ්ව විද්‍යාලයේ හපුගල ඉංජිනේරු පීඨයේ සිසුන් විසින් ශ්‍රමදානයක් පැවැත්වීම.

07. 2014.08.04 UNESCO නියෝජිත රත්නසිංහම් මහතා සමඟ Light House හෝටලයේ සාකච්ඡාවක් පැවැත්වීම.

08. 2014.08.20 ජපන් විශ්ව විද්‍යාල මහාචාර්යවරුන් පිරිසක් කොටුවේ සංචාරය කිරීම සහ මහාචාර්ය සමීත මානවඩු මහතා විසින් දේශනයක් පවත්වන ලදී.

09. 2014.08.28 අතිගරු ජනාධිපතිතුමා විසින් ගාලු කොටුව පැරණි කච්චේරි ගොඩනැගිල්ල සංරක්ෂණය කර සාප්පු සංකීර්ණය විවෘත කිරීම.

10. 2014.11.05 ගාලු උරුමය පදනමෙහි නිල වෙබ් අඩවිය www.galleheritage.gov.lk සඳහා ඉ-ස්වාභිමානී ජාතික සම්මානය හිමි කර ගැනීම. ජනාධිපති කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන නියෝජිත ආයතනය (ICTA) , විදුලි සංදේශ හා තොරතුරු අමාත්‍යාංශය සමග එක්ව තරඟකරුවන් 254ක් , කාණ්ඩ 9ක් යටතේ මෙම සම්මාන උලෙළ පැවැත්විනි.

11. 2014.11.14 ගාලු උරුමය පදනමේ ගාලු උරුම කේන්ද්‍රය හා ඉන්දීය ගැලරිය ගාල්ල කොටුව බාලදක්ෂ මාවතේ විවෘත කිරීම.

12. 2014.11.08 ගාලු උරුමය පදනම ඩේවිඩ් පීරිස් මෝටර් පුද්ගලික සමාගම සමඟ එක්ව ගාල්ල කොටුව තුල සංචාරක සේවා සපයන ත්‍රී රෝද රථ රියදුරන් සඳහා ස්වකීය රථ නඩත්තුව කිරීම පිළිබඳව එක් දින වැඩමුළුවක් පැවැත්වීම.

13. 2014.11.20 රජරට විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය කේ.ඩී. පරණවිතාන මහතාගේ ප්‍රධාන දේශනයකින් හා ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරික්වකින් යුත් "ඇසි දිසි ඉමෙන් එහා" ලෝක උරුම ගාලු කොටුව ජීවමාන නගරය පිළිබඳ රාජ්‍ය ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව ගාලු උරුමය පදනමේ සංවිධානයෙන් ගාල්ල බාලදක්ෂ මාවතේ හෝල්ඩ් ගෝල් ශාලාවේදී පවත්වන ලදී.

14. 2014 නොවැම්බර් ගාලු කොටුව සඳහා කලමනාකරණ සැලැස්මක් සකස් කිරීම.

2015 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

01. 2015.01.15 ජාතික සංහිදියාව හා සහයෝගිත්වයෙන් එක්ව වැඩකිරීමේ අරමුණු පෙරදැරි කරගෙන ජනතාව අති උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලබන තෙපොංගල් උත්සවය ගාලු උරුමය පදනමේ සහයෝගිත්වයෙන් බෞද්ධ ආගමික නායකයින්ගේද සහභාගිත්වයෙන් ගාල්ල කදිරවේලායුධ කෝවිලේදී අති උත්කර්ශවත් අයුරින් පවත්වන ලදී.

02. 2015.04.15 සිංහල දෙමළ අලුත් අවුරුද්දේ සිදු කෙරෙද්දී ගාලු උරුමය පදනම ඒ සඳහා මූලිකත්වය ලබාදෙමින් පාරම්පාරික වෛද්‍යවරුන්ගේ දායකත්වය ලබාගෙන ගාල්ල උසාවි වතුරස්‍රයේදී 250කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම උත්සවය චාරිත්‍රානුකූලව සිදු කරන ලදී. මෙහිදී විදේශිකයිනගේ සහභාගිත්වය ද විශේෂිත වූහ.

03. 2015.05.12 මහව ගල්ලැව වෙහෙර ආරණ්‍ය සේනාසනයේ සහ මාවතගම දොඩන්තලාව ආරණ්‍ය සේනාසනාධිපති විනයාචාර්යය, කම්මට්ඨානාචාර්යය පූජ්‍ය උඩුම්බර කාශ්‍යප හිමි විසින් පවත්වනු ලැබූ සුමධුර ධර්ම දේශනාවක් 2015.05.12 වන දින පස්වරුවේදි ගාල්ල හෝල් ඩී ගෝල් ශාලාවේදී පවත්වනු ලැබිය.

04. 2015.09.04, 05,06 දින අම්පාරේ නිලගිරි සෑයේ කැණීම්වලින් සොයාගන්නා ලද සර්වඥ ධාතූන් වහන්සේලා කොටුව ශ්‍රී සුධර්මාලය විහාරස්ථානයට වැඩමවා මහජනයාට පුද සත්කාර කිරීමට අවස්ථාව ලබාදුනි. මේ සඳහා ගාල්ල හා අවට ප්‍රදේශවලින් මෙන්ම දුර බැහැරින් ද විශාල බැතිමතුන් පිරිසක් සහභාගි වූ අතර, ත්‍රිවිධ හමුදාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දකුණු පළාත් සංස්කෘතික අමාත්‍යාංශය ආදී ආයතනවල සහයෝගය ලබාගන්නා ලදී.

05. ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි "සිප්නාරා" ගොඩනැගිල්ලේ කොටසක ගාලු උරුමය පදනම මඟින් අපනශාලාවක් පවත්වාගෙන යාම සඳහා බදු දී ඇත. මේ ගොඩනැගිල්ල ඉදිරිපස ඇති කාණුව සකස් කිරීම මෙම වසරේදී සිදු වූ අතර, ඒ සඳහා රු.251,417.00ක මුදලක් වැය කරන ලදී.

06. ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පැවති දිරාපත් වූ ගොඩනැගිල්ලක් ගාලු උරුමය පදනම වෙත පවරාගෙන අලුත්වැඩියා කරන ලදී. එසේ අලුත්වැඩියා කටයුතු නිම කරන ලද ගොඩනැගිල්ල තුල 2014 වසරේදී "උරුම කේන්ද්‍රය" නමින් තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කරන කරන ලදී. ඒ සමගම "උල්පත" විමර්ෂන පුස්තකාලයද මෙම ගොඩනැගිල්ල තුල ස්ථාපිත කරනු ලැබූ අතර, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ

අනුග්‍රහයෙන් ඉන්දියානු ගැලරියක් ද මෙම ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. මෙම තොරතුරු මධ්‍යස්ථානයෙන් ගාල්ල කොටුව පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විශාල පිරිසක් දිනපතා පැමිණෙති. මෙම ගොඩනැගිල්ලේ ඉතිරිව තිබූ වැඩ කටයුතු කිහිපයක් මෙම වසරේදී ද කිරීමට සිදු වූ අතර, මේ සඳහා වැය කළ මුදල රු.198,262.00 කි.

07. ගාලු කොටුවේ පිහිටි ලන්දේසි සන්ධ්‍යාර කුළුණ ලන්දේසි ගබඩා ගොඩනැගිල්ල ඉදිරිපිට කොටු බැම්ම මත පිහිටා ඇත. ලන්දේසීන් විසින් 18 වන සියවසේ මුල් අවධියේ ඉදිකර ඇති මෙය ඔරලෝසු කණුවක් වශයෙන් ඉදිකරනු ලැබූවකි. පසුගිය අවුරුදු 05 ක කාලය තිස්සේ සන්ධ්‍යාර කුළුණ අබලන් තත්වයේ පැවති අතර, ගාලු උරුමය පදනම විසින් මේ වසරේදී එහි සංරක්ෂණ කටයුතු කරන ලදී. ඒ සඳහා රු.807,275.00ක වියදමක් දරා ඇත.

08. ගාලු ඔරලෝසු කණුව යනු ගාල්ල කොටුවේ බ්‍රිතාන්‍ය ඉතිහාසයේ වාස්තු විද්‍යාත්මක අංගයකි. එහි ඉහල කොටස අකුණු ගැසීම නිසා හානියට පත්විය. ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම උදෙසා පරිපූර්ණ සංරක්ෂණ ව්‍යාපෘතියක් ගාලු උරුමය පදනම මගින් 2015.10.22 වන දින ආරම්භ කරන ලදී. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය මගින් මෙහි සංරක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. ඒ සඳහා මේ වසරේදී දරා ඇති වියදම රු. 4,892,148.00 කි.

09. ගාලු කොටුව සඳු අට්ටාලය මත පිහිටි ලන්දේසි අවදියේ ඉදිකල යුධකාමර 02ක ගාලු උරුමය පදනම විසින් පසුගිය වර්ෂ 02 මුළුල්ලේ සංරක්ෂණය කරනු ලැබූ අතර, ගාල්ල ඉතිහාසය පිළිබිඹු වන ගැලරියක් ස්ථාපනය කිරීමට මෙය යොදා ගනු ලැබේ. ඒ අනුව ගාලු ඉතිහාසයේ විවිධ සිදුවීම් නිරූපනය වන සිතුවම් 16ක් ද ප්‍රතිමා 12ක්ද අදාල පරිශ්‍රය තුල ස්ථාපනය කරනු ලැබීය. මෙහි අභ්‍යන්තර සැකසුම් කටයුතු සිදු කරන අතර, වායු සමීකරණය කිරීම, ආලෝකකරණය කිරීම ආදිය ඒ සඳහා ඇතුලත් වේ. ඒ සඳහා දරා ඇති වියදම රු.1,436,586.00 කි.

10. යුනෙස්කෝ සංවිධානයේ නිර්දේශයන් සම්පූර්ණ කිරීම උදෙසා ලෝක උරුම ගාලු කොටුව සඳහා විධිමත් කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය දිගු කලක් තිස්සේ පැවතුණි. මෙම සැලැස්ම සකස් කිරීම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීම මත ගාලු උරුමය පදනමට භාරවී තිබිණ. ඒ අනුව 2014 වර්ෂයේදී ඉදිරි කටයුතු ආරම්භ කළ අතර, මෙම වසරේදී එම කටයුතු නිම කිරීමට හැකි විය. මෙකී සැලැස්ම ගාල්ල කොටුවේ පදිංචි දෙස් විදෙස් ප්‍රජාවගේ අදහස් හා යෝජනා සහිතව සකස් කරනු ලැබ ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රශාන්ත බී.මණ්ඩාවල මහතා විසින් සකස් කළ මෙම කළමනාකරණ සැලැස්ම යුනෙස්කෝ ආයතනයේ පිළිගැනීමට ලක් වී ඇත.

ඒ අනුව මෙතෙක් කල් ගාලු කොටුවේ කළමනාකරණය සඳහා ප්‍රබල අඩුවක්ව පැවති කළමනාකරණ සැලැස්මක අවශ්‍යතාවසම්පූර්ණ වී ඇත. ඉදිරියේදී ගාලු උරුමය හා සම්බන්ධ සියළු ආයතන මෙකී සැලැස්මේ වැඩකටයුතු අරමුණු, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් මෙහෙයවීමේ වගකීම ගාලු උරුමය පදනම සතු වේ. මේ සඳහා වියදම සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය විසින් දරන ලදී.

11. ගාලු උරුමය පදනමේ පනතේ සඳහන් පරිදි යම් යම් කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදීමට හැකියාව ඇත. මෙම නියෝග සෑදීමට පෙර පනත බලගන්වනු සඳහා පනත සංශෝධනය කළ යුතු බවට නීති කෙටුම්පත් සම්පාදක මගින් ලබාදී උපදෙස් පරිදි පනත සංශෝධනය කිරීම මීට පෙරදී ආරම්භ කරන ලදී.

ඒ අනුව සංශෝධනයට අදාලව සකස් කළ යෝජනා ඇතුළත් සී ඒ/08/2015 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය නිර්දේශ කර 2015 වර්ෂයේ මැයි මාසයේදී අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. මෙහි ඉදිරි කටයුතු ඉදිරියේදී නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

12. 2015 වසරේ ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 10ක් පවත්වා ඇත. මෙම රැස්වීම් වාර වලදී ගාලු උරුමය පදනමේ කටයුතු සම්බන්ධ ඉතා වැදගත් තීන්දු හා තීරණ ගැනීමට හැකියාව ලැබී ඇත.

13. 2015.01.03 - පුහුණු වැඩසටහන

හින්දු භාෂාව හා භාරත සංගීතය හදාරන සිසුන් වෙනුවෙන් සංගීත පුහුණු වැඩසටහනක් ගාලු උරුම කේන්ද්‍රයේදී ආරම්භ කරනු ලැබිය.

14. 2015.01.26 – දැනුවත් කිරීමේ වැඩසටහන

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ගාලු උරුමය පදනමේ සම්පත් දායකත්වයෙන් "ජාතික උරුමයන් හා ලංකාවේ ලෝක උරුමයන්" පිළිබඳ දැනුවත් කිරීමේ දේශනයක් මාතර ජනාධිපති විද්‍යාලයේදී පවත්වන ලදී. ඒ සඳහා සිසුන් 350 දෙනෙකු පමණ හා ගුරුවරුන් 15 දෙනෙකු පමණ සහභාගී වූහ.

15. 2015.03.20 සිට 22 දක්වා - බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන

(මඩකලපුව සහ ගාල්ල)

බලකොටු නගරවල පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර දැනුම හුවමාරු අධ්‍යාපනික වැඩසටහනක් ගාල්ල වක්වැල්ල කළමණාකරන පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙහිදී මඩකලපුවේ සිසුන් 25ක් හා ගුරුවරු 05 දෙනෙකුත් කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරියෙකුත් 2015 මාර්තු 20 වන දින මඩකලපුවේ සිට දුම්රියෙන් ගාල්ලට පැමිණි අතර, ගාල්ලේ පාසැල් ද 05 ක සිසුන් 25 ක් හා ගුරුවරුන් 05 දෙනෙක් ද දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් ද ඔවුන් විසින් ගාල්ල දුම්රිය ස්ථානයේ දී පිළිගනු ලැබිය. බලකොටු නගර දෙකෙහිම සිසුන් එක්ව විවිධ ක්‍රියාකාරකම්වල නිරත වූ අතර, ගාල්ල හා මාතර බලකොටු නැරඹීමට අධ්‍යාපනික වශයෙන් වැදගත් කෞතුකාගාර වැනි ස්ථාන නැරඹීමටත් හා විවිධ විෂයන්ගේ දැනුම අවබෝධය ලබා දීමටත්, තරග පවත්වා ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රධානය කිරීමටත්, විවිධ සංස්කෘතික

වැඩසටහන් පැවැත්වීම සඳහා අවස්ථාව ලබාදීමත් සිදු කරන ලදී. තෙදින නේවාසික වැඩසටහනක් වූ මෙය සියලු සිසුන්ගේ ජාතික සමගිය මෙන්ම විවිධ දක්ෂතාවන් මුසුවූ ක්‍රියාශීලීවූත් සුහදශීලී වූත් වැඩසටහනකි. මේ සඳහා රු.363,525.00 ක මුදලක් වියදම් ලෙස දරා ඇත.

16. 2015.03.29 "දැයේ උරුමය ළමයින්ටයි වැඩසටහන"

(දහම් පාසැල් ළමුන් අතර දැනුම වර්ධනය)

කඩවත්සතර සාශනාරක්ෂක බල මණ්ඩලයේ දහම් පාසල් දරු දැරියන්ගේ චරිත වර්ධනය සඳහා පැරණි (ගද්‍ය, පද්‍ය සංග්‍රහයන්) පත පොත ආශ්‍රිතව දැනුම් මිනුම් තරගයක් 2015.03.29 වන දින පෙ.ව.9.00ට ගාල්ල කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධස්ථානයේ විහාරාධිපති, කඩවත්සතර සාශනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී, කණුමුල්දෙණිය වන්දවිමල නාහිමියන්ගේ අනුශාසනාව හා මූලිකත්වයෙන් ගාල්ල කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මේ සඳහා සිසුන් 80කට ආසන්න ප්‍රමාණයක් සහභාගී වූ අතර,එහිදී වැඩි පිරිසක් සතුටුදායක ලෙස ලකුණු ලබාගෙන විභාගය සමත් වීමෙන් අනතුරුව 2015.05.24 වන දින කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේදී ත්‍යාග හා සහතිකපත් ප්‍රධානෝත්සවය පවත්වන ලදී.මේ සඳහා රු.35,412.00 වියදමක් දරණ ලදී.

17. 2015.09.29 "ඇසිදිසි ඉමෙන් එහා" වැඩසටහන (ඇනුවත් කිරීමේ වැඩසටහන)

ගාලු උරුමය පදනම් මඟින් සංවිධානය කරනු ලබන දැනුවත් කිරීමේ දේශන මාලාවේ එක් වැඩසටහනත් ලෙස, -"ඇසිදිසි ඉමෙන් එහා" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙහි තවත් වැඩසටහනක් 2015.09.29 වන දින ගාල්ල හෝල්ඩ් ගෝල් ශාලාවේදී පවත්වන ලදී. දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය හා අනුමැතිය ඇතිව ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතිහාසය හා ඊට සමගාමී විෂයන් හදාරන සිසු සිසුවියන්ගේ සහභාගීත්වයෙන් මෙම දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා දේශනය පවත්වනු ලැබුවේ මහාචාරිය කේ.ඩී.පරණවිතාන මහතා විසිනි. වියදම රු.112,544.00කි.

18. ගාල්ල කොටුව සහ උරුම් කළමනාකරණය පිළිබඳ දේශන සහ දැනුවත් කිරීම්

- 2015.01.27 – "ශ්‍රී ලංකා ඉන් ස්ටයිල් ට්‍රැවල් ඒජන්සි" ආයතනය මඟින් ගාලු කොටුවේ සංවිධානය කරන ලද විදේශිකයන්ගේ සංචාරයේදී උරුම් කළමනාකරණ පිළිබඳ දේශනයක් පවත්වන ලදී.
- 2015.07.08 - ගාල්ල කොටුවේ යුධ හමුදා කඳවුරේ සාමාජිකයන් සඳහා ලෝක උරුමයන් ගැන දේශනයක් පවත්වන ලදී.
- 2015.07.15 - බූස්ස යුධ හමුදා කඳවුරේ සාමාජිකයන් සඳහා තවත් දේශනයක් පවත්වන ලදී.

- 2015.10.18 - ගාල්ල සිංහ සමාජයේ සාමාජිකයන් සඳහා ලෝක උරුම ගාලු කොටුව පිළිබඳව දේශනයක් පවත්වන ලදී.
- ඇල්පිටිය පොලිස් අභ්‍යාස පුහුණු ආයතනයේ නිලධාරීන් සඳහා මෙම වසරේදී අවස්ථා කිහිපයකදීම දේශන පවත්වන ලදී.
- ගාලු උරුමය පදනමේ ජංගම ආරක්ෂක නියාසක ශිරංග ජයසේකර මහතා විසින් ගාලු කොටුවේ ක්ෂේත්‍ර චාරිකා සමගින් විවිධ දැනුවත් කිරීම් 25ක් මෙම වර්ෂය තුළදී සිදු කර ඇත. මෙහිදී විවිධ පාසල්, ස්වේච්ඡා සංවිධාන, විදේශීය කණ්ඩායම්, විශ්ව විද්‍යාල කණ්ඩායම් සහ විවිධ ආයතන මෙම සේවාව ලබාගෙන ඇත.

- ගාලු උරුමය කේන්ද්‍රය මගින් මෙම වසරේදී දේශීය හා විදේශීය පිරිස් වෙත කොටුවේ තොරතුරු ලබාදීම, කොටුවේ ක්ෂේත්‍ර චාරිකා සූදානම් කිරීම හා මාර්ගෝපදේශන සේවාවන් ලබාදීම සිදුකරන ලදී. විදේශීය පිරිස් අතර ජපානය, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, ඇමරිකාව, නෙදර්ලන්තය, චීනය, ඩෙන්මාර්කය, නවසීලන්තය හා ඉන්දියාව ආදී රටවල පිරිස් ඇතුලත් වේ. පාසල් සිසුන්, විශ්ව විද්‍යාල ස□සුන්□හා නොයෙක් අධ්‍යාපන ආයතනවල කණ්ඩායම් සඳහා උල්පත විමර්ශන පුස්තක□ලය මගින් නොමිල□ තොරතුරු ලබාදීම සිදු කරන ලදී.

2016 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. ගාලු කොටුවේ ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම

   ගාලු කොටුවේ සුවිශේෂී වාස්තු විද්‍යාත්මක නිර්මාණයක් මෙන්ම ගාලු කොටුවේ අනන්‍යතාව වශයෙන් හඳුනාගත් බ්‍රිතාන්‍ය පාලන සමයේ ඉදිකරනු ලැබූ ඔරලෝසු කණුව සංරක්ෂණය කිරීම ගාලු උරුමය පදනම විසින් සිදු කරනු ලැබීය. මෙය මධ්‍යම උපදේශක කාර්යාංශය විසින් සිදු කරන ලදී.

   රලෝසු කණුවේ පැවති ප්‍රඔ ,වැටී ගිය ඔරලෝසු කණුවේ මුදුණත පසී පෙළ අලුත්වැඩියා කිරීමත් පැරණි ස්වරූපයට සකස් කිරීමත් ,දිය සෙවෙල ඉවත් කර සංරක්ෂණය කිරීම හා ආරක්ෂක ආලේපනයක් යෙදීම , කණුව තුළ පිහිටි විදුලි ලාම්පු පද්ධතිය විධිමත් ලෙස අලුත්වැඩියාකරනු ලැබිය.

2. සඳු ඇට්ටාලයේ යුධ කාමරය සංරක්ෂණය කිරීම

   මෙම සඳු ඇට්ටාලයට වායු සමීකරණ කට්ටලයක් 2015 දී සවි කරන ලද අතර මේ සඳහා සවි කරන ලද විදුලි රැහැන් පද්ධතිය ආවරණය කල යුතු බවත් එබැවින් එහි පැරණි ස්වරූපයට ගැලපෙන පරිදි ලී රාමුවක් සවි කිරීම සිදු විය.

3. ගාලු කොටුවේ පදිංචි කරුවන් තම නිවාස වෙනත් සැලසුමකට සකස් කිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය මගින් පනවා ඇති නිති රෙගුලාසිවලට අනුව සැලසුම් සකස් කිරීම කළ යුතු වේ. ඒ සඳහා නාගරික සංවර්ධන අදිකාරිය මගින් අදාල ආයතන නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් මාසිකව පවත්වනු ලබන සැලසුම් අනුකමිටුව සඳහා නියෝජිත ආයතනයක් වශයෙන් සහභාගී වී සැලසුම් නිවැරදි ලෙස අනුමත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සිදු කර ඇත.

4. ලෝක බැංකු ආධාර ව්‍යාපෘතිය යටතේ මෙගාපොලිස් ආයතනය සිදුකරනු ලබන ගාල්ල කොටුව සංවර්ධනය කිරීම සඳහා සැලසුම සකස් කිරීමට අදාලව දායකත්වය ලබා දීම. ගාල්ල කොටුවතුළ පිහිටි රජයේ ආයතන විසින් හාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සඳහා සංරක්ෂණ සහ පසු හාවිත සැලසුම් සකස් කිරීම

5. 2016.01.29, 30, 31 සහ පෙබරවාරි බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන - දක්වා 01 (ත්‍රිකුණාමලය සහ ගාල්ල)

UNESCO සංවිධානය මගින් ලෝක උරුමයක් ලෙස නම්කර ඇති ගාලු කොටුව ප්‍රවර්ධනය කිරීම න් වාදී ජනරජය විසිජාතන්ත්‍ර ලංකා ප්‍රභා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ,සංරක්ෂණය කිරීම ,1994 අංක 07 දරණගැසට් පත්‍රය මගින් ගාලු උරුමය පදනම් පිහිටුවා ඇත ලංකාවේ අනෙකුත් ශ්‍රී. බලකොටු හා ගාල්ල ඓතිහාසික බලකොටුව අතර දැනුම හුවමාරු වැඩසටහන් මගින් සියළු එසේම බලකොටු නගර අතර ,බලකොටු සංරක්ෂණය කිරීම ආරක්ෂා කිරීම පරමාර්ථ කරගෙන යාත්මක කිරීම යටතේක්‍රි දැනුම හුවමාරු වැඩසටහන්මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

6. බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන (2016.06.03- 06 දක්වා)

(මඩකලපුව -ගාල්ල)

බලකොටු නගරවල පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර දැනුම හුවමාරු අධ්‍යාපනික වැඩසහනක් මඩකලපුව කේන්ද්‍රීයව එහි සර්වෝදය මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි. මෙහිදි ගාල්ලේ පාදල් 5 කින් සිසුන් 25 ක් ද, ගුරුවරු 5ක්ද ඇතුලුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තුමා ඇතුලු ගාලු උරුම පදනමේ නිලධාරින් 2016.06.03 වන දින මඩකලපුවේ සර්වෝදය මධ්‍යස්ථානයට පැමිණි පසු මඩකලපුවේ පාසල් 5කින් සිසුන් 25 ක් සහ ගුරුවරුන් 5 ක් ද, කලාප අධ්‍යාපන කාර්යාලයෙන් නිලධාරින් ඇතුලු පිරිස එක්ව දෙමළ සංස්කෘතියට අනුව ඉමහත් හරසරින් සියලු දෙනාම පිළිගනු ලැබූහ .බලකොටු නගර දෙකෙහිම සිසුන් එක්ව විවිධ ක්‍රියාකාරකම්වල නිරත වූ අතර මංගල මහාවිහාරය, ජාමිඋස් සලාම් මස්ජිද් පල්ලිය,මාමංගේෂ්වර පිල්ලෙයාර් කෝවිල, ක්‍රිස්තියානි දේවස්ථානය සහ පාසිකුඩා වැනි ස්ථාන නැරබීමටත්, හා විවිධ විෂයන්ගේ දැණුම අවබෝධය ලබා දීමටත් තරග හා විවිධ සංස්කෘතික

වැඩසටහන් පැවැත්වීම සිදු විය. මෙය තෙදින නොවාසික වැඩසටහනක් වූ අතර සිසුන්ගේ ජාතික සමගිය මෙන්ම විවිධ දක්ෂතාවයන් මුසු වූ ක්‍රියාශීලිවූත් සුහදශීලී වූත්, වැඩසටහනකි.

7. 2016.05.15"දැයේ උරුමය ළමයින්ටයි වැඩසටහන"

(දහම් පාසැල් ළමුන් අතර දැනුම වර්ධනය)

කඩවත්සතර සාසනාරක්ෂක බල මණ්ඩලයේ දහම් පාසල් දරු දැරියන්ගේ චරිත වර්ධනය සඳහා පැරණි පොත පත (ගද්‍ය පද්‍ය සංග්‍රහයන්) ආශ්‍රිතව දැනුම් මිනුම් තරගයක් 2016.05.15 වන දින පෙ.ව. 9.00 ට ගාල්ල කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ විහාරාධිපති, කඩවත් සතර සාසනාරක්ෂක බලමණ්ඩලයේ ලේඛකාධිකාරී කනුමුල්දෙනියේ වන්ද විමල නාහිමියන්ගේ මූලිකත්වයෙන් ගාල්ල කලුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ දී පවත් වන ලදි.

8. ගාලු උරුමය පදනම මගින් සංවිධානය කරන ලද ලෝක උරුම ගාලු කොටුව සඳහා සකස් කරනු ලැබූ කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව අදාළ ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී.

9. විදේශිය නියෝජිතයන් දැනුවත් කිරීම

ගාලු වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී ලෝක උරුම ගාලු කොටුවට සිදුවන බලපෑම් පිළිබඳ වත්මන් තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා යුනෙස්කෝ සංවිධානයේ විශේෂ නියෝජිත මිවල් මොරිසම් මහතා ඇතුළු නියෝජිත පිරිසගේ පැමිණීම සිදු වූ අතර ගාලු කොටුවෙහි තොරතුරු සොයාබැලීමට ගාලු කොටුවෙහි සංචාරය කරන අතර තුර ගාලු උරුමය පදනමේ තොරතුරු මධ්‍යස්ථානය නැරඹීම ද සිදු විය .

- ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ කෙටි කාලීන පාඨමාලා හදාරණ සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා "ජාතික උරුමයන් හා ලංකාවේ ලෝක උරුමයන්" පිළිබඳ සෑම මාස දෙකකට වරක්ම දැනුවත් කිරීමේ දේශන පවත්වන ලදී.
- ගාලු කොටුවේ අනවසර ඡායාරූපගත කිරීම් සංඛ්‍යාත්මක වශයෙන් 55ක් නැවැත්වීමට හැකි විය. මෙහි දී ඩ්‍රෝනර් නැමැති කැමරා විශේෂය භාවිතා කිරීම බහුල වශයෙන් සිදු කෙරිණ.
- නාගරික සංවර්ධන අදිකාරියේ නිති රෙගුලාසිවලට පටහැනිව සිදුකරන ලද ගාලු කොටුවේ අනවසර ඉදිකිරීම් 32ක් වාර්තා කිරීමට හැකි වූ අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කරමින් ඉදිරි පියවරයන් ගැනීමට යොමුකර තිබේ.
- ගාලු කොටුව තුළ සිදුවන, සිදු කරන අසංවර හැසිරීම් මෙන්ම විනය විරෝධී ක්‍රියා 12කට අධික අවස්ථා පාලනය සඳහා මැදිහත් වී කටයුතු කිරීම.

10. 2016 වසරේ කළමනාකරණ මණ්ඩල කමිටු රැස්වීම

2016 වසරේ ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 9ක් පවත්වා ඇත. මෙම රැස්වීම් වාර වලදී ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය ලෙසින් ගාලු උරුමය පදනම පනත ප්‍රකාරව සිටින නිල සාමාජිකයන් ගණන දාහතර දෙනෙකි. එයට අමතරව අදාළ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හයදෙනෙක් සහ මණ්ඩලයේ නිල බලයෙන් පත්වූ සාමාජිකයන් විසින් තෝරා පත්කර ලනු ලබන සාමාජිකයන් හය දෙනෙකුගෙන් සමන් විත වේ.

11. මුද්‍රණ කටයුතු-:

විදේශිය සංචාරකයන්, පාසල් සිසුන් ඇතුළුව ලෝක උරුමයක් වන ගාලු කොටුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් දැනුවත් කිරීමේ අරමුණින් ගාලු උරුමය පදනමේ මුද්‍රණයක් ලෙස අලෙවිය සඳහා ප්‍රථම වරට ගාලු කොටුවේ තොරතුරු ඇතුළත් "පවුරක උරුමය" නමින් අත්පොතක් සිංහල හා දෙමළ භාෂාවෙන් මුද්‍රණය කරන ලදී. මෙහි ඉංග්‍රිසි පිටපත පරිවර්ථන මට්ටමේ පවතී.

- පොක්, සිතියම්, පිංතූර, පොස්කාඩ් හා අත්පත්‍රිකා ආදිය සංඛ්‍යාත්මක වශයෙන් 1200කට අධික ප්‍රමාණයක් අලෙවි කිරීමට හැකි වී ඇත.

12. "උල්පත" විමර්ශන පුස්තකාලය පරිහරණයට අවස්ථාව ලබා දීම සහ ගාලු කොටුව පිළිබඳ ඓතිහාසික තොරතුරු ලබාගැනීමට පහසුකම් සැපයීම තොරතුරු මධ්‍යස්ථානය මගින් සිදු කරයි.

2017 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. තෛපොංගල් උත්සවය සැමරීම - දින 2017.01.14 ජාතික සංහිඳියාව හා සහයෝගිතාවයෙන් එක්ව වැඩකිරීමේ අරමුණු පෙරදැරි කරගනිමින් ජනකාව අති උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලබන තෛපොංගල් උත්සවය ගාලු උරුමය පදනමේ අනුග්‍රහයෙන් සියලුම ආගමික නායකයින්ගේ ද සහභාගිත්වයෙන් ගාල්ල කදිරවේලායුද හින්දු කෝවිලේ දී අති උත්කර්ශවත් අන්දමින් පවත්වන ලදී. මේ සඳහා අපගේ ආරාධනයෙන් රාජ්‍ය නිලධාරීන් ඇතුළු 100කට අධික පිරිසක් සහභාගි වූහ. ගාලු උරුමය පදනමේ සංස්කෘතිකමය වැඩසටහනක් ලෙස වාර්ෂිකව සංවිධානය කරනු ලබන අතර , මෙවරද එම වැඩසටහනට දායකත්වය ලබා දෙන ලදී.

2. සිංහල දෙමළ අලුත් අවුරුද්දේ සිදු කරන පාරම්පාරික චාරිත්‍ර ක්‍රමවේදයක් ලෙස හිසතෙල් ගෑමේ චාරිත්‍රය වාර්ෂිකව සිදු කෙරෙද්දී ගාලු උරුමය පදනම ඒ සඳහා මූලිකත්වය ලබාදෙමින් පාරම්පරික වෛද්‍යවරුන්ගේ දායකත්වය ලබාගෙන ගාල්ල උසාවි වතුරස්‍රයේදී 300කට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම උත්සවය චාරිත්‍රානුකූලව සිදු කරන ලදී. මෙහිදී විදේශිකයින්ගේ සහභාගිත්වයද විශේෂිත වූහ. මෙම අවස්ථාව වර්ණවත් කරමින් පහතරට නර්තන සම්ප්‍රදායේ සුවිශේෂී නර්තන අංශ සහිත සංස්කෘතික සංදර්ශනයක් පවත්වන ලදී.

3. සිංහල බෞද්ධ ජනයාගේ ආගමික වශයෙන් වැදගත්වන වෙසක් පොහොය නිමිත්තෙන් ගාලු නගරය වෙත ඇදෙන විශාල පිරිසකට ගාලු නගරයේ පෞඩත්වය විදහාපාන ඓතිහාසික ලෝක උරුම ගාලු කොටු පවුර ඉතා අලංකාරව විදුලි පහන් දල්වා ආලෝකමත් කරන ලදී.

4. ගාල්ල කොටුවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් හට පහසුකම් සැලසීමේ අරමුණින් කෆා වැසිකිළිය අලුත්වැඩියා කටයුතු ආරම්භ කරන ලදී.

5. ගාලු උරුමය පදනමෙහි තොරතුරු මධ්‍යස්ථානය කොටුව බාලදක්ෂ මාවතේ පිහිටා ඇති අතර මෙමගින් ලෝක උරුම ගාලු කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදු කරයි. මෙතෙක් පැවති පහසුකම් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් 2017 වර්ෂයේදී තොරතුරු මධ්‍යස්ථානය නවීකරණය කිරීම ආරම්භ කරන ලදී.

6. 2017.09.15- 18 බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන

(මන්නාරම සහ ගාල්ල) - VI අදියර

ලෝක උරුම ගාලු කොටුව ආරක්ෂා කිරීමත් කොටුව පිළිබඳ සංරක්ෂණය කිරීමත් ගාලු, දැනුවත් කිරීමත් අරමුණු කර ගනිමින් පෙරියකුව්විකුලම් විද්‍යාලයේ නේවාසිකව සිට මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ යඳහා මන්නාරම දිස්ත්‍රික්කයෙන් පාසල් 05ක් සිසු ගුරුවරුන් 25ක් ද ගාල්ල දිස්ත්‍රික්කයෙන් පාසල් 05ක් සහ සිසු ගුරුවරුන් 25ක් ද සහභාගි විය. එමෙන්ම මඩුකලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාත් ,කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරින්ද ගාලු උරුමය පදනමේ කාර්යමණ්ඩලයද සහභාගි විය. මෙමගින් විවිධ විෂයන්ගේ දැනුම ලබා දීමටත් , විවිධ සංස්කෘතික වැඩසටහන් පැවැත්වීමටත්, මන්නාරම දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ දේශන පැවැත්වීමටත් , එම දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන නැරඹීමටත් අවස්ථාව ලබා දෙන ලදී. නේවාසික වැඩසටහනක් වූ මෙය සියලු සිසුන්ගේ ජාතික සමගිය මෙන්ම විවිධ දක්ෂතාවයන් මුසුවූ ක්‍රියාශීලී වූත් වැඩසටහනකි.

7. උරුම කළමනාකරණය සඳහා පැවැත් වූ ධාරිතා වැඩසටහන ගාල්ල කොටුව දෙස් විදෙස් සංචාරකයින්ට වඩාත් ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීම සඳහා ගාල්ල කොටුවේ පිහිටා ඇති විවිධ යුධ ඉදිකිරීම් පිළිබඳ සුවිශේෂී අත්දැකීම් ලබන ස්ථාන බවට පත් කිරීම ගාලු උරුමය පදනමේ අපේක්ෂාවයි.

ඒ අනුව ගාල්ල කොටුව ආශ්‍රිතව රාජකාරි කටයුතු වල නිරත වන විවිධ මට්ටමේ නිලධාරින්හට උරුමයන්ගේ වටිනාකම අර්ථකථනය කිරීම සඳහා ධාරිතා සංවර්ධනය කිරීම වෙනුවෙන් දෙදින වැඩමුළුවක් 2017.07.04, 05 දින තුල ගාල්ල කොටුවෙහි දී ක්‍රියාත්මක විය.

සම්පත් දායකයින් ලෙස නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ අනුග්‍රහය යටතේ පෝල් එරියස් සහ මැක්ස් මෝර් යන කෞතුකාගාර විශේෂඥයින් දෙපල සහභාගි විය.

ඒ අනුව ගාල්ල කොටුවේ මුර අට්ටාල ආශ්‍රිතව පිහිටි යුධ කාමර සංචාරකයින් සඳහා අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරන ස්ථාන බවට පත්කිරීම සඳහා වැඩමුළුවේදි සැලසුම් සකස් විය.

8. රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම

ගාලු කොටුවෙහි ටොන් 5ට වඩා බර වැඩි හා මීටර් 3ට වඩා උස වාහන ඇතුළු කිරීම නතර කිරීම 2017.10.01 සිට ක්‍රියාත්මක කිරීම කරන ලදී. මෙය 2009 වර්ෂයේ ගැසට් කරනු ලැබූ නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ නියමතා පද්ධතියට ඇතුලත් වූ නීතියකි.

9. කොටුව තැපැල් කාර්යාලයේ නුග ගස විනාශ කිරීම

තැපැල් කාර්යාලයේ ගොඩනැගිල්ලේ පරිහානියට හේතු වී තිබූ විශාල නුග ගස පුද්ගලික ආයතනයක් ලවා රසායනික උපක්‍රම භාවිතා කර විනාශ කරමින් සිදු වීමට තිබූ විශාල හානිදායක තත්වයක් මහ හරවා ගැනීමට විශාල පිටුවහලක් විය. මෙම ව්‍යාපෘතිය ගාලු උරුමය පදනම කළමනාකරණ මණ්ඩල සාමාජික ආචාර්ය නිලාන් කුරේ මහතාගේ අධීක්ෂණය මත සිදු විය.

10. ගාල්ල කොටුව ගොඩනැගිල්ල සඳහා පසුභාවිත සකස් කිරීම

ලෝක උරුම ගාල්ල කොටුව සඳහා සකස් කරනු ලැබූ කළමනාකරණ සැලැස්මට අනුව ගාල්ල කොටුවේ පිහිටි විවිධ වටිනාකම් සහිත ගොඩනැගිලි සඳහා සංරක්ෂණ සැලසුම් සකස් කිරීම සඳහා ගාලු උරුමය පදනම විසින් කටයුතු ආරම්භ කරන ලදි. එහිදී රජය විසින් ගනු ලැබූ ආර්ථික ප්‍රතිපත්ති වලට අනුව රජයේ කාර්යාල විසින් භාවිත කරන පැරණි ගොඩනැගිලි වලින් එකී කාර්යාල ඉවත් කර ඒවා සුදුසු භාවිතයන් සඳහා සංරක්ෂණය කිරීම වෙනුවෙන් කැබිනට් පත්‍රිකාවක් නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව ගාල්ල කොටුවෙන් ඉවත් කල යුතු කාර්යාල හඳුනාගෙන ඒ සඳහා ලිඛිතව එකී ආයතන දැනුවත් කරන ලදී. එසේ කාර්යාල ඉවත් කරනු ලැබූ ගොඩනැගිලි ඉවත් කිරීම සඳහා සංරක්ෂණ සැලසුම් සකස් කිරීම වෙනුවෙන් වාස්තු විද්‍යාඥයින් කණ්ඩායමක් ද හඳුනා ගනු ලැබීය.

11. ගාලු කොටුවෙහි වෙනත් සංරක්ෂණ සේවාවන්

- 2017.10.18වන දින ජයලත් ක්ලිනින් සර්විස් ආයතනය මඟින් ගාලු කොටුව පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයක් ගාලු උරුමය පදනමේ සහයෝගයෙන් සිදු කරන ලදී.

12. වෙනත් දැනුවත් කිරීම්

- ගාලු කොටුවේ අනවසර ඡායාරූප ගත කිරීම් සංඛ්‍යාත්මක වශයෙන් 40ක් පමණ නැවැත්වීමට හැකි විය. මෙහිදී ඩ්‍රෝනර් කැමරා විශේෂය භාවිතා කිරීම නතර කිරීමට හැකි විය.
- නාගරික සංවර්ධන අධිකාරියේ නීති රෙගුලාසිවලට පටහැනිව සිදුකරන ලද ගාලු කොටුවේ අනවසර ඉදිකිරීම වාර්තා කිරීමට හැකි වූ අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කරමින් ඉදිරි පියවරයන් ගැනීමට යොමුකර තිබේ.
- ගාලු කොටුව තුළ සිදු කරන අසංවර හැසිරීම් මෙන්ම විනය විරෝධී ක්‍රියා පාලනය සඳහා මැදිහත් වී කටයුතු කිරීම.

2018 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. තෛපොංගල් උත්සවය 2018.01.14

ජාතික සංහිඳියාව හා සහයෝගීත්වයෙන් එක්ව වැඩ කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන ජනතාව අති උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලබන තෛපොංගල් උත්සවය ගාලු උරුමය පදනමේ සහයෝගීතාවයෙන් බෞද්ධ ආගමික නායකයින්ගේ සහභාගීත්වයෙන් ගාල්ල කදිරවේලායුධ කෝවිලේදී අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

2. හිසතෙල්ගෑමේ උත්සවය 2018.04.16

සිංහල දෙමළ අලුත් අවුරුදු වාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීමේදී හිසතෙල් ගෑමේ වාරිත්‍රයට සුවිශේෂී ස්ථානයක් ලබාදෙමින් පාරම්පරික වෛද්‍යවරුන්ගේ දායකත්වයෙන් ගාලු උරුමය පදනම වාර්ෂිකව සිදුකරනු ලබන කාර්යයකි .මේ සඳහා ජාති ආගම් භේදයකින් තොරව සිංහල, දෙමළ, මුස්ලිම් ජාතින්ගේ සහභාගිත්වයෙන් ආගමික ආශිර්වාද ඉටු කිරීම සුවිශේෂී වේ. දේශීය වෛදවරුන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවති මෙම උත්සවය වර්ණවත් කිරීම සඳහා දේශීය නර්තන අංග රැසක් ද ඉදිරිපත් කෙරුණි

3. තොරතුරු මධ්‍යස්ථානයේ අලුත්වැඩියා කටයුතු

2018 වර්ෂයේදී ගාලු කොටුවේ පිහිටා ඇති උරුම කේන්ද්‍රය (තොරතුරු මධ්‍යස්ථානය) අලුත්වැඩියා කර නව මුහුණුවරකින් ආරම්භ කිරීම සිදුවිය. මෙමගින් දේශීය හා විදේශීය පිරිස් වෙත කොටුවේ තොරතුරු ලබා දීම, කේෂ්ත්‍ර චාරිකා සුදානම් කිරීම , මාර්ගෝපදේශ සේවාවන් ලබා දීම සිදු කරයි.

4. ගාලු උරුමය පදනම වෙබ් අඩවිය සකස් කිරීම.

ගාලු උරුමය පදනමේ පවතින යල් පැනගිය වෙබ් අඩවිය වෙනුවට සියලුම දෙස්විදෙස් , සංචාරකයින්ට හා සියලුම වෙබ් පරිශීලකයන්ට ලෝක උරුම ගාලු කොටුව පිළිබඳව තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි විධිමත්ව ත්‍රිභාෂාවෙන් සැකසුම්න් පවති. මේ වන විට එහි ඉංග්‍රීසි වෙබ් ව්‍යුහය නිර්මාණය කර අවසන් අතර ,දෙමළ /සිංහල භාෂාවන්ගෙන් වෙබ් ව්‍යුහය නිර්මාණය කරමින් පවති. වෙබ් අඩවියේ නාමය වනුයේ www.galleheritage.gov.lk ය .

5. ගාලු උරුමය පදනමට නව කාර්යාලයක් ලබාගැනීම

ගාලු කොටුවේ පිහිටි දිස්ත්‍රික් ලේකම්තුමා සතු පැරණි ගොඩනැගිල්ලක් රුපියල් මිලියන 2.4ක් වැය කර අලුත්වැඩියා කර ගාලු උරුමය පදනම කාර්යාලය පිහිටුවන ලදී.

6. රුහුණු විශ්ව විද්‍යාලයේ සිසුන්ගේ සහභාගිත්වයෙන් ගාලු කොටුවේ සමීක්ෂණයක් පැවැත්වීම

රුහුණු විශ්ව විද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ ඉගෙනුම ලබන සිසුන් 15 දෙනෙකුගෙන් යුත් ශිෂ්‍ය කණ්ඩායමක් සම්බන්ධ කර ගනිමින් තොරතුරු සමීක්ෂණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ ඔල්සෙන්ට්ස් විද්‍යාලය පිළිබඳව සහ ගාල්ල කොටුවේ රථවාහන භාවිතය පිළිබඳව සමීක්ෂණයක් සිදු කරනු ලැබීය.

7. ගාලු කොටුවේ තණකොළ කැපීම හා නඩත්තු කටයුතු සිදු කිරීම

ගාලු කොටුව සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරීමේදී කලාප දෙකක් වශයෙන් බෙදා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් කොන්ත්‍රාත්තුකරුවන් තෝරා ගනිමින් තණකොළ කැපීම සිදු කරයි.

8. නෙදර්ලන්තයේ සිට පැමිණි කෞතුකාගාර විශේෂඥයින් සමඟ (Max and Paul) ගාලු කොටුවේ මුර අට්ටාල සඳහා සැලසුම් සකස් කිරීම .

ගාල්ල කොටු බැම්මේ ඇති යුධ කාමර ඇතුළු විවිධ යුධ ඉදිකිරීම් සංරක්ෂණය කර ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ ආකර්ෂණය වර්ධනය වන පරිදි විවිධ ප්‍රදර්ශන මැදිරි ස්ථාපනය කිරීමට ගාලු උරුමය පදනමෙන් සහ නෙදර්ලන්ත තානාපති කාර්යාලය විසින් විවිධ කටයුතු කරනු ලබයි. ඒ අනුව නෙදර්ලන්තයේ කෞතුකාගාර විශේෂඥයින් දෙපලක් නෙදර්ලන්ත තානාපති කාර්යාලය මගින් සම්බන්ධ කර දුන් අතර, ඔවුන් සමඟ එක්ව ගාල්ලේ ඉතිහාසය පිළිබඳව ආකර්ෂණීය ලෙස සංචාරකයින් දැනුවත් කිරීමට සැලසුම් සකස් කිරීම ඇරඹින ලදී.

9. ගාලු උරුමය පදනමේ සංවර්ධන නිලධාරී තරංග ලියනආරච්චි මහතා විසින් පවත්වන ලද ගාල්ල කොටුව සහ ලෝක උරුම කළමනාකරණය පිළිබඳ දේශන සහ දැනුවත් කිරීම

- රුහුණු සංචාරක කාර්යාංශයේ ආරාධනාව මත දකුණු පළාතේ සංචාරක මහ පෙන්වන්නන්ට ලෝක උරුමයක වැදගත්කම හා සංචාරකයින් මෙහෙයවන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම .
- ඇල්පිටිය පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවන පොලිස් නිලධාරීන් 500 කටපමණ දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම
- ගාල්ල හා තිස්සමහාරාම ත්‍රීරෝද රථ හිමියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම .

- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සිසුන්ට වැඩමුළුවක් හා කොටුවේ ක්ෂේත්‍ර චාරිකාවක් පැවැත්වීම.
- සැප්තැම්බර් මස විවිධ රටවල් නියෝජනය කරමින් විදේශ සං 2018වාරකයින් ගාල්ල කොටුව නැරඹීමට පැමිණි අතරඔවුන් පිළිගෙන කොටුව පිළිබඳව දැනුම්වත් කිරීමේ , වැඩසටහන ගාලු උරුමය පදනම මගින් සිදු කරනු ලැබීය.

10. බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහන VII

ත්‍රිකුණාමලය හා ගාල්ල බලකොටු නගර අතර දැනුම හුවමාරුව VII අදියර පෙබරවාරි 16 සිට 19 දක්වා ත්‍රිකුණාමලය සර්වෝදය මධ්‍යස්ථානය කේන්ද්‍රීයව පවත්වනලදී. මෙහිදි ත්‍රිකුණාමලය පාසල් 05ක් නියෝජනය කරමින් පාසල් ළමුන් 25ක් සහ ගුරුවරු 05දෙනෙක් ද ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් 05ක් නියෝජනය කරමින් ළමුන 25ක් සහ ගුරුවරු 05දෙනෙක් ද වශයෙන් සහභාගි විය. ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහයෝගය හා මගපෙන්වීම යටතේ සියලු සිසුන් විවිධ ක්‍රියාකාරකම් වල යොදවමින් ඔවුන් අතර සංහිදියාව වර්ධනයට මහෝපකාරිව විවිත්‍රවත් අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නැරඹිය යුතු සුවිශේෂී ස්ථාන කිහිපයක් නැරඹීමට ද අවස්ථාව සැලසීම සිදු කරන ලදී. දින 02ක් පැවැත්ත මෙම වැඩසටහන මගින් නැගනහිර දකුණු පළාත්වල සංහිදියාව මිතුදම යම්තාක් දුරට ඇති කිරීමට හැකිවූවා සේම එකිනෙකා අතර වූ වැරදී අවබෝධයන්ද මග හැරීමට ද හේතු විය.

2019 වර්ෂය

සිදු කරන ලද කාර්යයන්

1. 2019.05.18 සහ යන දෙදින 19සිංහල බෞද්ධ ජනයාගේ ආගමික වශයෙන් වැදගත්වන වෙසක් පොහොය නිමිත්තෙන් ගාලු නගරය වෙත ඇදෙන විශාල පිරිසකට ගාලු නගරයේ පෞඪත්වය විදහාපාන ඓතිහාසික ලෝක උරුම ගාලු කොටු පවුර ආලෝකමත් කිරීම සිදු කරන ලදී.

2. ගාලු උරුමය පදනම සඳහා නිබු යල්පැන ගිය සරල වෙබ් අඩවිය වෙනුවට වඩාත් කාර්යක්ෂම ලෙස සේවාවන් ලබා ගැනීමට හැකිවන ලෙස වෙබ් අඩවිය සංවර්ධනය කර නව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සිදු වියෙඓතිහාසික වැදගත් සහ ය වටිනාකමගාලු කොටුවෙහි ඇති විශ්වී කම් පිළිබඳ සියලු ජනතාව වෙත ලගා කරමින් ගාලු උරුමය පදනමේ සේවාවන් වඩාත් කාර්යක්ෂම ලෙස සේවාලාභීන් වෙත ලබා දීමත් අපේක්ෂාවෙන් නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී .

ඒ අනුව වෙබ් අඩවිය නිර්මාණය කිරීමේ ආයතනය ලෙස Bellvantage (pvt) Ltd ආයතනය කටයුතු කරන ලදී. වෙබ් අඩවියට ඇතුලත් කල යුතු තොරතුරු ගාලු උරුමය පදනමෙන් ලබා දෙන ලදී. වෙබ් අඩවිය නිර්මාණයට අදාළ තාක්ෂණික උපදේශකත්වය ලබුදුව ,ප්‍රධාන අමාත්‍යාංශයේ පරිගණක වැඩසටහන් සම්පාදක පී.ඒ. සජීවනි මහත්මිය විසින් සිදු කරන ලදී.

නිල වෙබ් අඩවිය තෙහාෂාවෙන් තොරතුරු ඇතුලත් කර නිර්මාණය කිරීම අවසන් කරමින් 2019.03.29 දින ජනතාව වෙත විවෘත කිරීම ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සහභාගිත්වයෙන් සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ වන්න දාස්වත්ත මහතාගේ සුරතින් සිදු කරන ලදී.

වෙබ් අඩවිය වෙත වෙබ් servers පහසුකම් ලබා ගැනීම ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණික නියෝජිත ආයතනය)ICTA) සමඟ එක්ව සිදු කරන ලදී. www.galleheritage.gov.lk නමින් වෙබ් අඩවිය සාර්ථකව ක්‍රියාත්මක වීම සිදු වේ.

3. පොසොන් පොහොය නිමිත්තෙන් ගාලු කොටු පවුර ආලෝකමත් කිරීම සඳහා 2019.06.16 දින සිට 2019.06.18 දින දක්වා කොටු පවුර ආලෝකමත් කිරීම සිදු කරන ලදී.

4. ගාලු උරුමය පදනම සහ රුහුණු සංචාරක කාර්යාංශය විසින් සංවිධානය කරන ලද අප්‍රිකානු සම්භවයක් සහිත සිරම්බඅඩි හි වෙසෙන ශ්‍රී ලාංකීය ජන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන කලා ප්‍රසංගය ඔරලෝසු කණුව ඉදිරිපිට පිහිටි එළිමහන් පරිශ්‍රයේ දී පවත්වන ලදී.

5. දේශීය නියෝජිතයන් දැනුවත් කිරීම

- 28/01/2019වන දින මොරටුව විශ්ව විද්‍යාලයේ නගර සැලසුම් අධ්‍යන අංශයේ දේශීය හා විදේශීය සිසුන් හා ඔවුන්ගේ ආචාර්යවරුන් සමඟ පිරිස් 60ක පමණ කණ්ඩායමක් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් හා දේශනයක් සිදු කිරීම .
- 02/04/2019දින බදුල්ල මුතුමාල විද්‍යාලයේ සිසුන් ,දෙමව්පියන් සහ ආචාර්යවරුන් පිරිස් 100ක පමණ කණ්ඩායම සඳහා මාර්ගෝපදේශනයක් සිදු කරන ලදී.
- එසේම 04/2019/ 02සහ 03වන දින ගාල්ල මවුන්ට් කැල්වරි උසස් පාසලෙහි 07වන සහ 08වන ශ්‍රේණිවල ළමුන් සඳහා ක්ෂේත්‍ර චාරිකාවක් ශිරංග මහතා විසින් සිදු කරන ලදී.

6. බලකොටු නගර අතර දැනුම හුවමාරු වැඩසටහනෙහි VIII අදියර 2019.10.05 සිට 08 දින දක්වා යාපනය දිස්ත්‍රික්කය කේන්ද්‍රිය පවත්වන ලදි. මෙම අදියර සඳහා ගාල්ල- යාපනය නියෝජනය කරමින් ගාල්ල දිස්ත්‍රික්කයෙන් පාසල් 5කින් ළමුන් 25ක් ද ගුරුවරු 05ක්ද යාපනය දිස්ත්‍රික්කයෙන් ළමුන් 25ක් හා ගුරුවරු 05 ද සහභාගි විය. එසේම මෙම වැඩසටහන සඳහා ජාතික සමඟි සංහිදියා කාර්යාංශයේ අධ්‍යක්ෂ සහ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හිටපු නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) ජේ.කේ.රාජපක්ෂ මහතා , ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ ඩී.කේ.එස්.ජයලක්ෂ්මී මැතිනිය , දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ මනෝජ් පද්මලාල් මහතාත්, උතුරු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.උදයකුමාර් මහතා, යාපනය කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ එස්.සුන්දර රාජා මහතා, යාපනය කලාප අධ්‍යාපන සහකාර අධ්‍යක්ෂ දර්මිකා මහත්මිය, යාපනය අධ්‍යාපනය අධ්‍යක්ෂ ජේ. බාලසිඟම් මැතිනිය,නල්ලූර් කලාප අධ්‍යාපන නිලධාරි එෆ්.එක්ස් ඇන්ටන් මහතා සහ ගාලු උරුමය පදනම කාර්යය මණ්ඩල නිලදාරින් ද ඇතුළුව ජාතික සමඟි සංහිදියා කාර්යාංශයේ නිලධාරින් ගේ සහභාගිත්වය සිදු විය.

7. විදේශිය නියෝජිතයන් දැනුවත් කිරීම

- 19/01/2019වන දින දකුණු අප්‍රිකාවනු මහ කොමසාරිස් වන රොබීනා මහත්මිය ගාලු කොටුව සංචාරය කරන ලද අතර ඇයට ගාල්ල කොටුව පිළිබඳ දැනුම්වත් කිරීමක් කරන ලදී.

8. සමාජ සුභ සාධන වැඩසටහන්

- ගාල්ල කොටුවේ කොඩිගල අසළ කොටු බැම්මට පහලින් තිබූ මූදිල්ලා ගස් 02ක් අකුණු සැර වැදීමෙන්මිය යෑමට ලක්වුණි. මෙම ප්‍රදේශය ආශ්‍රිතව දෙස් විදෙස් සංචාරකයින් බහුලව ගැවසෙන බැවින එම ගස් දෙක ඉවත් කිරීම සිදු කළ යුතුව තිබූ බැවින් එම ගස් දෙක 2019.01.25 වන දින බවත් කරන ලදි.
- උද්හිත නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ගාල්ල කොටුවේ රෝහල් වීදියේ ලංකා බැංකුව ඉදිරිපිට තිබෙන මාර ගසෙහි අතු පැස්සීම රු.38.000/- ක වඅය කොට සිදු කරන ලද අතර ඉදිරියට මෙම මාරගස් නඩත්තු කරන ආකාරය පිළිබඳව ගාලු උරුමය පදනමේ නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී.

9. ශ්‍රමදාන වැඩසටහන්

- ජුනි 05 යෙදෙන ජගත් පරිසර දිනය නිමිත්තෙන් 2019 මැයි 30 සිට ජුනි 05 දක්වා විවිධ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික පරිසර සතිය නිමිති කරගෙන සිදු විය. මේ යටතේ ගාලු උරුමය පදනම විසින් ගාලු කොටුවෙහි ප්‍රදීපාගාරය අසළ වෙරළ තීරය හා භූමිය පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන වැඩසටහක් සිදු කරන ලදි

10. ලෝක උරුම ගාලු කොටුව නැරඹීමට පැමිණි සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම.

වැසිකිළි පද්ධති නවීකරණය කිරීම

ලංකාවේ ලෝක උරුම අතුරින් ප්‍රශස්ත අගයන් සහිත ගාල්ල කොටුව නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයෝ විශාල ප්‍රමාණයක් පැමිණෙති. එලෙස පැමිණෙන නරඹන්නන් ගණන සීඝ්‍රව ඉහල යන නිසා ඔවුන්ට අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා අදියර කිහිපයක් ඔස්සේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ගාලු උරුමය පදනම කටයුතු කරමින් පවති. ඒ යටතේ ගාල්ල කොටුව බාලදක්ෂ මාවතේ පිහිටි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම ආරම්භ කරන ලදි. දැනට වර්ෂ ගණනාවකට කලින් මෙම වැසිකිළි පද්ධතිය ඉදිකර තිබූ අතර ගාල්ල මහ නගර සභාව විසින් නඩත්තු කටයුතු කර ගෙන යනු ලැබීය .

එසේ වුවත් වැසිකිළි පද්ධතිය අබලන්ව පැවතීම නිසා දෙස් විදෙස් සංචාරකයන් සඳහා මෙය හාවිතා කිරීම අපහසු මට්ටමක පැවතුණි.එසේම කොටු බැමීම ආඝන්නයේ මෙම වැසිකිළි පද්ධතිය ඉදිකර තිබූ අතර ගොඩනැගිලි වාස්තු විද්‍යාත්මක හැඩය ඉපැරණි වාස්තු විද්‍යාත්මක ලක්ෂණ වලට නොගැලපෙන බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව දිරා ගිය මෙම වැසිකිළි පද්ධතිය සම්පූර්ණව ඉවත් කළ අතර දෙස් විදෙස් සංචාරකයින්ට ගැලපෙන ආකාරයෙන් වඩාත් නවීන තාක්ෂණික පහසුකම් සහිතව ගාල්ල කොටුවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට ගැලපෙන පරිදි නව වැසිකිළි පද්ධතියක් ඉදිකරනු ලැබීය.

11. සුරක්ෂිත සංචාරක පරිශ්‍රයක් ගාලු කොටුව තුල නිර්මාණය කිරීම

ගාලු කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින්ගේ සහ කොටුව තුල ජීවත් වන පුරවැසියන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ගාලු උරුමය පදනමේ අවධානය යොමු කරනු ලැබීය. ඒ යටතේ ගාලු කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් ගාල්ල කොටුව තුල වැඩි කාලයක් රදවා ගැනීම අරමුණු කරගෙන සක්‍රීය සංචාරක පරිශ්‍රයක් බවට ගාල්ල කොටුව පත්කරගෙන ප්‍රදේශයටම ලැබෙන ආදායම තර කර ගැනීම මෙහි අරමුණ විය.

12. ගාලු කොටුවේ භූමි නඩත්තු හා පවිත්‍රතා කටයුතු කිරීම.

සංචාරක පුරවරයක් ලෙස ප්‍රවර්ධනය කෙරෙන ලෝක උරුම ගාලු කොටුව ප්‍රෙද්ශයේ නඩත්තු කටයුතු යටතේ තණකොළ කැපීම හා කොටු පවුර වටා ඉවත ලන අපද්‍රව්‍ය ඉවත් කිරීම් වශයෙන් කාර්යයන් දෙකක් ඉටු කරනු ලබයි.

මෙහිදි ප්‍රසම්පාදන කටයුතු මගින් තණකොළ කැපීම් කළාප දෙකක් වශයෙන් බෙදා කොන්ත්‍රාත් කරුවන් දෙදෙනෙකු යටතේ මසකට වරක් වශයෙන් තණකොළ කපා නඩත්තු කිරීමේ කාර්යයන් සිදු කරනු ලබයි. මේසඳහා රු.167,500.00 ක මුදලක් මසකට වෙන්කරනු ලබයි.

13. ගාලු කොටුවේ ගොඩනැගිලි සංරක්ෂණය කිරීම

ගාලු කොටුවේ ගොඩනැගිලි සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළමු අදියරයේ දී සිදු කළ යුතු ගොඩනැගිලි 6ක් සඳහා සංරක්ෂණ සැලසුම් සකස් කිරීම සිදු විය.

- මහේස්ත්‍රාත් නිල නිවස සහ ගාලු උරුමය පදනම කාර්යාලය
- පල්ලිය වීදියේ පොලිස් නිල නිවස
- මාර්ග සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල
- රෝහල් වීදියේ පොලිස් සේවාසථ පුහුණු ඒකක සමඟ ගොඩනැගිලි 03
- කුඩා කේවතු සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල
- පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල

වෙනත් ක්‍රියාකාරකම්

- නාගරික සංවර්ධන අධිකාරි පණත අනුව ගාලු කොටුව තුළට වාහන ඇතුළු කිරීම සීමා කිරීම සඳහා උස මීටර් 3ක් සහ ටොන් 5 කට වඩා වැඩි බරින් යුතු වාහන ඇතුලත් කිරීම් නවතා දැමීමට කටයුතු කරන ලදී.
- රාත්‍රී මුර සංචාර පොලීසිය සමඟ ගාලු කොටුව තුළ සිදුවන, අසංවර හැසිරීම් මෙන්ම විනය විරෝධී ක්‍රියා 21 පමණ පාලනය සඳහා මැදිහත් වී කටයුතු කරන ලදී.
- අපගේ උපදෙස් මත ආගමන විගමන නිළධාරීන් සමඟ එක්ව කරන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස ගාලු කොටුව තුළ වීසා බලපත්‍ර නොමැතිව රැදිසිටින විදේශිකයින් 05 දෙනෙකු සොයා ගන්නා ලද අතර අදාළ ආයතන ඒ සඳහා ඉදිරි පියවරන් ගැනීමට යොමුකර තිබේ.
- නාගරික සංවර්ධන අධිකාරියේ නීති රෙගුලාසිවලට පටහැනිව සිදුකරන ලද ගාලු කොටුවේ අනවසර ඉදිකිරීම් 01 ක් වාර්තා කිරීමට හැකි වූ අතර ඒ සඳහා අදාළ ආයතන දැනුවත් කරමින් ඉදිරි පියවරන් ගැනීමට යොමුකර තිබේ.

2020 වර්ෂය

නව වසර සැමරීම 2020 . 01.01

2020 වසරේ ජනවාරි 01 වන දින රාජකාරී කටයුතු ආරම්භයට ප්‍රථමව ,කාර්යාලයේ සියලුම නිලධාරීන් හා සහෝදර ආයතන නිලධාරීන්ගේ ද සහභාගීත්වය ඇතිව ආගමික වතාවත් වල යෙදෙමින් සෙත්පිරිත් සච්ඡායනයක් ශ්‍රවනයකර එහි ආශිර්වාද ලබා ගෙන සියලු දෙනා එක්ව කැවිලි පෙවිලිවලින් යුතු සංග්‍රහයක් භුක්තිවිඳ සතුටින් සාමයෙන් සුහදව සිය රාජකාරී කටයුතු ආරම්භ කරන ලදඅතරමෙය ගාලු උරුමය ,පදනම විසින් කරනු ලබන සංස්කෘතිකමය වැඩසටහනක් වන අතර පිරිවැය දරනු ලබන්නේ නිලධාරීන් වීම විශේෂ වේ .



සංවර්ධන ව්‍යාපෘති

1. ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ ව්‍යාපෘතිය

   ගාල්ල කොටුවේ පිහිටි වාස්තු විද්‍යාත්මක වශයෙන් ඉහල වැදගත්කමක් සහිත පැරණි ගොඩනැගිලි රාශියක් රජයේ කාර්යාල වශයෙන් භාවිතා කරනු ලබයි. විශේෂයෙන්ම බිත්‍රාන්‍ය පාලන සමයේ ගාල්ල කොටුව දකුණු පළාතේ ප්‍රධාන පරිපාලන කේන්ද්‍රය බවට පත්කිරීම සඳහා රජයේ කාර්යාල බොහොමයක් පැරණි ලන්දේසි ගොඩනැගිලි වල ස්ථාපනය කරනු ලැබීය. එකී කාර්යාල කිහිපයක්ම ගාල්ල කොටුව තුල පවත්වාගෙන යනු ලබයි. මෙකී ගොඩනැගිලි බොහොමයක් ලෝක උරුමයක් වශයෙන් ගාල්ල කොටුවේ කැපී පෙනෙන විශ්වීය වටිනාකම ඉහල නංවන වැදගත්කම් රැසකින් යුක්ත වේ. ඒ නිසාම එකී ගොඩනැගිලි ඉතාම ප්‍රවේශමෙන් සංරක්ෂණය කර පවත්වාගෙන යාමට පෙළඹවීම ගාලු උරුමය පදනමේ කාර්යභාරය වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ පළමු වෙනි පියවර ලෙස ගොඩනැගිලි ඒකක 06ක සැලසුම් සකස් කරන ලදී. එකී ගොඩනැගිලි ඒකක 06 පහත පරිදි වේ.

I. ගාලු උරුමය පදනම කාර්යාලය විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිල්ල

(මෙම ගොඩනැගිල්ල 17 වන සියවසේ ලන්දේසින් විසින් වෙඩිබෙහෙත් ඇඹරීම සඳහා ඉදි කරනු ලැබූ ඉතා වටිනා ගොඩනැගිල්ලක් වන අතර 1830 දශකයේ බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් රාජ්‍ය නිලධාරින්ගේ නිල නිවාස වශයෙන් සංවර්ධනය කරනු ලැබීය. වර්තමානයේ මෙහි එක් කොටසක් ගාලු උරුමය පදනමේ කාර්යාලය වශයෙන්ද අනෙක් කොටස මහේස්ත්‍රාත්තුමාගේ නිල නිවාස වශයෙන් ද භාවිතා කරනු ලබයි.)

II. පැරණි තැපැල් කාර්යාලය

(පල්ලිය වීදියේ පිහිටා ඇති ගොඩනැගිල්ල 17 වෙනි සියවසේ මුල් අවධියේ ලන්දේසින් විසින් ඉදිකරනු ලැබීය. එකළ ප්‍රධාන පරිපාලන ව්‍යුහය සහ කාර්යාල සහයකයින්ගේ නිල නිවාස වශයෙන් මෙය භාවිතා විය. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙය ප්‍රධාන ආහාර ගබඩාව වශයෙන් යොදාගනු ලැබූ අතර 1915 න් පසු ගාල්ල ප්‍රධාන තැපැල් කාර්යාලය ලෙස භාවිතා කරනු ලැබීය. ගොඩනැගිල්ල වර්තමානයේ ඉක්මණින් සංරක්ෂණය කල යුතු තත්වයේ පවති.)

III. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල

(පල්ලිය වීදියේ පිහිටා ඇති මෙම ගොඩනැගිල්ල 19 වෙනි සියවසේ මුල් අවධියේ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ඉදිකරනු ලැබූ කම්කරුවන්ගේ සහ කම්කරු අධීක්ෂකගේ නිල නාවස වශයෙන් භාවිතා කරනු ලැබීය. වර්තමානයේ මෙම ගොඩනැගිල්ල ගාලු උරුමය පදනමට භාර දී ඇත.)

IV. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිල්ල

(ප්‍රදීපාගාර වීදියේ සහ රැම්පාට් වීදියේ හෝරා ගොඩනැගිල්ලක් වශයෙන් 19 වෙනි සියවසේ මැද භාගයේ බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් ඉදිකරන ලදී. මුල් අවධියේ නිවාස වශයෙන් භාවිතා වූ මෙම ගොඩනැගිල්ල වර්තමානයේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පවත්වා ගෙන යනු ලබයි.)

V. රෝහල් වීදියේ පිහිටි පොලිස් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 03

(ගාල්ල කොටුව රෝහල් වීදියේ පිහිටි පැරණි ගොඩනැගිලි 03ක් ගාල්ල පොලිස් දෙපාර්තමේන්තුව විසින් දිගු කාලයක් තිස්සේ ස්වකීය විවිධ කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. ඉන් එක් ගොඩනැගිල්ලක් බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් ද්විමහල් ගොඩනැගිල්ලක් ලෙස 20 වන සියවසේ මුල් භාගයේදී පොලිස් බැරක්ක වශයෙන් ඉදිකරනු ලැබීය. මෙම ගොඩනැගිල්ල වර්තමානයේ පොලිස් අභ්‍යාස විද්‍යාලය ලෙස භාවිතා කරනු ලබයි.

අනෙක් ගොඩනැගිලි 02ක 18 වෙනි සියවසේ ලන්දේසින් විසින් ඉදිකරනු ලැබූ අතර පසු කාලීනව බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් විවිධ වෙනස්කම් වලට භාජනය කර පොලිස් දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගනු ලැබීය.

වර්තමානයේ මෙයින් එක් ගොඩනැගිල්ලක් සම්පූර්ණයෙන්ම කඩා වැටී ඇත.)

VI. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිල්ල

(ගාල්ල කොටුවේ පැරණි ඔරලෝසු කණුව ආසන්නයේ පිහිටා ඇති වාස්තු විද්‍යාත්මක වශයෙන් ඉහල වටිනාකමක් සහිත මෙම ගොඩනැගිල්ල බ්‍රිත්‍යා පාලන සමයේ ඉදිකරන ලද්දකි. මුල් අවධියේ ගාල්ල බ්‍රිත්‍යානා පොලිසියේ පොලිස් පරික්ෂක විසින් ස්වකීය නිල නිවාස ලෙස භාවිතා කරනු ලැබීය. පසුව බ්‍රිත්‍යානායින් විසින් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් ලෙසද වර්තමානයේ මාර්ග සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලය ලෙසද භාවිතා කරනු ලැබීය)

උක්ත ව්‍යාපෘතිය සඳහා පුවත්පත් දැන්වීමක් මගින් සුදුසු වාස්තු විද්‍යාඥයින් සහ වාස්තු විද්‍යා ආයතන තෝරාගනු ලැබීය. තෝරා ගත් පිරිසකගෙන් උක්ත ගොඩනැගිලි සඳහා මිල ගණන් කැඳවා අවම මිල ගණන් ලබා දුන් ආයතන 02කින් මෙම ව්‍යාපෘතිය සිදු කරනු ලැබිය.

01. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිලි පිටුපස පිහිටි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම- පල්ලිය විදිය (2020 දෙසැම්බර්)

ගාල්ල කොටුවේ පල්ලිය වීදියේ පිහිටි පැරණි පොලිස් නිවාස ගොඩනැගිල්ල ගාලු උරුමය පදනමට භාරදීමත් සමඟ එකී නිල නිවාසයේ නේවාසිකයින් විසින් භාවිතා කර වැසිකිළි පද්ධතියද අලුත්වැඩියා කිරීමට තීරණය කරන ලදී. විශේෂයෙන් ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට සුදුසු තත්වයේ වැසිකිළි පහසුකම් නොමැති වීම බරපතල අර්බුදයක්ව පැවතුණි. මෙයට විසඳුමක් වශයෙන් සහ සුදුසු ස්ථානයක ස්ථීර වැසිකිළි පද්ධතියක් සකස්වන තෙක් මෙම වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීමට තීරණය විය. ඒ අනුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගාල්ල කාර්යාලය මඟින් මෙහි ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු සහ අධික්ෂණය කිරීමේ කටයුතු සිදු කරනු ලැබූ අතර ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් සිදු කරනු ලැබීය. මෙහි ස්ත්‍රී පුරුෂ සංචාරකයින් මෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දෙස් විදෙස් සංචාරකයින් සඳහාද පහසුකම් සලසා ඇත. වැය කළ මුදල රුපියල් මිලියන 2.1කි.

02. ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි පැරණි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම.

ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා යටිතල පහසුකම් සකස් කිරීමේ ව්‍යාපෘතියේ නවත් පියවරක් ලෙස ගාල්ල කොටුව බාලදක්ෂ මාවතේ පිහිටි පැරණි වැසිකිළි පද්ධතියක් සංවර්ධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව වසර 20කට පමණ ප්‍රථම ස්වේච්ඡා සංවිධානයක් විසින් ඉදිකර ගාල්ල නගර සභාව විසින් පවත්වාගෙන ආ මෙම වැසිකිළි පද්ධතිය කොටු බැමිම ආශ්‍රිතව ඉදිකර තිබුණද ගාල්ල කොටුවේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට

නොගැලපෙන හෙයින් සුදුසු වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත ගොඩනැගිල්ල නැවත අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරන ලදී. ඒ අනුව විශේෂ අවශ්‍යතා සහිත සංචාරකයින්ටද භාවිතා කළ හැකි ලෙස ගොඩනැගිල්ල සංවර්ධනය කරනු ලැබූ අතර ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය විසින් ඇස්තමේන්තු සකස් කර අධික්ෂණ කටයුතු සිදු කරනු ලැබූ අතර ගෝනුපිනුවල අනුයි කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් මෙහි ඉදිකිරීම් කටයුතු කරන ලදී. සංවර්ධනය කරන ලැබූ වැසිකිළි පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා ගාල්ල නගර සභාව වෙත භාරදෙන ලදී.





03. ගාල්ල කොටුවේ පැරණි හැඩයේ ආලෝක පහන් පද්ධතිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය

ගාල්ල කොටුවේ විවිධ ස්වරූපයේ ආලෝක පහන් දක්නට ලැබේ. ඒ අතර විදුලි කණු මත සවි කරනු ලැබූ ආලෝක පහන්ද ගොඩනැගිලි බිත්ති මත සවිකරනු ලැබූ ආලොක් පහන් පද්ධතියක් ද වේ.

එකී ගොඩනැගිලි බිත්ති මත සවිකරනු ලැබූ ආලෝක පහන් පද්ධතිය ගාල්ල කොටුවට සෞන්දර්යයන් එකතු කරන හැඩයකින් යුක්ත වේ. මෙම ආලෝක පහන් පද්ධතිය 1980 දශකයේ වරාය අධිකාරියේ ව්‍යාපෘතියක් ලෙස සකස් කරනු ලැබූ ඒවාය. කාලයක් තිස්සේ මෙකී විදුලි පහන් අක්‍රීයව පැවතීම නිසා මෙම ව්‍යාපෘතිය යටතේ විදුලි ලාම්පු 150ක් එහි කේබල් පද්ධතියද සමඟින් අලුත්වැඩියා කරනු ලැබීය. අලුත්වැඩියාවෙන් පසු පවත්වාගෙන යාම සඳහා ගාල්ල නගර සභාවට භාරදෙන ලදී.

04. සඳු ගැලරියේ සංවර්ධන කටයුතු

ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා නව අත්දැකීමක් ලබා දෙනු පිණිස ගාල්ල කොටුවේ සඳු යුධ අට්ටාලය පිහිටි පැරණි යුධ කාමරයක් ගාලු උරුමය පදනම විසින් සංරක්ෂණය කරනු ලැබීය.

සංරක්ෂණ කිරීමෙන් පසු එහි ගාල්ල කොටුවේ ඉතිහාසය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් ස්ථාපනය කිරීම සඳහා ගාල්ල ඉතිහාසය හා සම්බන්ධ සිදුවීම් 16ක් ඇතුලත් කැන්වස් මත නිර්මාණය කරනු ලැබූ සිතුවම් පුවරු 16ක්ද ඉතිහාසයේ සිදුවීම් 12කට අදාලව පුද්ගල රූප නිරූපනය කරන ප්‍රතිමා 16ක් ද සකස් කරනු ලැබීය.

මෙම ගැලරිය තවදුරටත් සංවර්ධනය කිරීමේ කටයුතු 2020 වර්ෂයේ සිදු කරන ලදී. ඒ අනුව කැන්වස් මත අඳිනු ලැබූ සිතුවම් 16 සඳහා අර්තකථන සිතුවම් 65ක් නිර්මාණය කරනු ලැබීය.

.





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. GAL/E/GHF/2020/FA/26 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021 දෙසැම්බර් 23 දින

ගාලු උරුමය පදනම

සභාපති,

ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2(...න සහ

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී චිත්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :- 1. ලේකම් - මුදල් අමාත්‍යාංශය

2. ලේකම් - ජාතික උරුම, ප්‍රායාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. GAL/E/GHF/2020/FA/26

ඔබේ අංකය உமது இல. Your No

දිනය திகதி Date 2021 දෙසැම්බර් 23 වැනි.

සභාපති,

ගාලු උරුමය පදනම.

ගාලු උරුමය පදනමේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ගාලු උරුමය පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ගාලු උරුමය පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක යාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීකත්වය ගාල්ල උරුමය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම් හා ගාල්ල උරුමය පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ගාල්ල උරුමය පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ආනික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන සේ දේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනී හෝ සාමූහික ලෙස බලපෑම් නියා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමෙදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වදරවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාවිත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුනද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- ඔද්ධින් හෝ තත්ත්වයන් හේතුවෙන් ගාලු උරුමය පදනමේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පදනමේ අබණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ සදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත ඔද්ධින් හෝ තත්ත්වයන් මත අබණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල විසූහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා ඔද්ධින් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන යොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

02. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගාල්ල උරුමය පදනමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනමට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සාපූව හෝ අනියෝජකයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති, රීති/විධානයට යොමුව	නිරීක්ෂණය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි අංක 756	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් කළ යුතු වුවද, ඊට අනුකූලව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ගාල්ල උරුමය පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

1994 අංක 07 දරන ගාල්ල උරුමය පදනම පනතේ II වන කොටසෙහි 12 (1) ඡේදය ප්‍රකාරව පදනමේ කටයුතු සිදුකර ගෙන යාම සඳහා ඊට අරමුදලක් ඇති කළ යුතු වුවද, ගාල්ල උරුමය පදනම සඳහා එවැනි අරමුදලක් ගොඩ නහා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ගාලු උරුමය පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිකිරිතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

ගාලු උරුමය පදනම භාරයේ ඇති පල්ලිය වීදියේ පොලිස් නිල නිවාස ලෙස භාවිතා කළ ගොඩනැඟිල්ලේ පිටුපස පිහිටි වැසිකිළි පද්ධතිය රු. 1,966,306 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණද, විගණිත දිනය වූ 2021 අප්‍රේල් 06 දින වන විටත්, එම වැසිකිළි පද්ධතිය අගුළු දමා වසා තිබුණි.

03. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) ගාලු කොටුවේ සදු මුර අට්ටාලයේ පිහිටි පැරණි ලන්දේසි යුධ කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිඹිබු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු. 11,760,121 ක් වියදම් කර තිබුණද, එම සදු මුර අට්ටාලය ප්‍රදර්ශන ගැලරියක් බවට පත්කර නොතිබුණි.

(ආ) ගාලු උරුමය පදනමට අවශ්‍ය බලතල ලබා ගැනීමට හා පදනම් සඳහා ආදායම් උත්පාදනය නංවාලීම යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම් පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධනයක් සිදු කර නොතිබුණි.

(ඇ) වීථි ලාම්පු සවි කිරීමේ පළමු අයියර වෙනුවෙන් රු.1,784,544 ක්ද, දෙවන අයියර වෙනුවෙන් රු.2,395,266 ක්ද ලෙස පදනම විසින් වියදම් දරා නගර සභාව පවරා දී තිබුණද, වැය වූ රු.4,179,810 ක මුදල් විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 16 දින තෙක් විදුලි බල සමාගමෙන් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.

(ඈ) 2020 ජනවාරි 01 දිනට පදනමේ ගබඩාව තුළ රු.698,497 ක වටිනා පොත් හා අන් පත්‍රිකා තොගයක් ඉතිරිව පැවැතියදී, වර්ෂය තුළ අවශ්‍යතාවය නොසලකා හැර රු.275,000 ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණි. මෙම නිසා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.954,634 ක ඉතිරි තොග ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) රු.7,126,837 ක් වැය කර ඉදිකර තිබූ කෆෑ වැසිකිළි පද්ධතිය සහ පල්ලිය විදිය, වැසිකිලි පද්ධතිය ආදායම් උපයා ගැනීම සඳහා ශිවිසුමකින් තොරව මහ නගර සභාවට පවරා දී තිබුණි. එම නිසා පදනමට ලබා ගැනීමට තිබූ ආදායම් අහිමි වී තිබුණි.

(ඊ) ප්‍රධාන විධායක නිලධාරී, පරිපාලන නිලධාරී යන තනතුරු, ව්‍යාපෘති සහකාර තනතුරු 02 ක් හා ආරක්ෂක නියාමක තනතුරු 02 ක පුරප්පාඩු පැවති නමුත්, එම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. ඩී. වික්‍රමරත්න
විගණකාධිපති

<u>වර්ෂයේ කාර්යසාධනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව</u>

1. ගාලු කොටුවේ පිහිටි රාජ්‍ය ආයතන විසින් හාවිතා කරනු ලබන පැරණි ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ ව්‍යාපතිය සිදු කිරීම.ඒ යටතේ ගොඩනැගිලි 06 ක සැලසුම් සකස් කිරීම සිදු විම.
   I. ගාලු උරුමය පදනම කාර්යාලය විසින් හාවිතා කරනු ලබන ගොඩනැගිල්ල
   II. පැරණි තැපැල් කාර්යාලය
   III. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිල්ල
   IV. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් හාවිතා කරනු ලබන ගොඩනැගිල්ල
   V. රෝහල් වීදියේ පිහිටි පොලිස් දෙපාර්තමේන්තුව විසින් හාවිතා කරනු ලබන ගොඩනැගිලි
   VI. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් හාවිතා කරනු ලබන ගොඩනැගිල්ල
2. පැරණි පොලිස් නිල නිවාස ගොඩනැගිලි පිටුපස පිහිටි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම-පල්ලිය විදිය
3. ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ පිහිටි පැරණි වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම.
4. ගාල්ල කොටුවේ පැරණි හැඩයේ ආලෝක පහන් පද්ධතිය අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම.
5. සඳු ගැලරියේ සංවර්ධන කටයුතු සිදු කිරීම.

<u>කාර්යසාධනය වර්ධනය කරගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග</u>

කෙටිකාලීන ක්‍රියාමාර්ග

- ❖ ගාලු උරුමය පදනමේ වර්තමාන අනුමත කාර්යමණ්ඩල සැලැස්ම තුල නාක්ෂණික නිලධාරීන් ඇතුලත්ව නොමැත. ඒ මඟින් සංවර්ධන කටයුතු තුලදී ඇස්තමේන්තු සැකසීම ප්‍රමාද වීම හේතුවේ. මෙම තත්වය මගහරවා ගැනීම සඳහා දිස්ත්‍රික් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම කාර්යාංශ වෙතින් දැනට අවශ්‍යතා සපුරා ගැනිමේ කටුයුතු සිදු කරගනිමින් පවතී.
- ❖ බඳවා ගැනිමේ පටිපාටිය සංශෝධනය කිරීමට අදහස් කර ඇති අතර එයට ඉහත තනතුරු ද ඇතුලත් කිරීමට අපේක්ෂා කෙරේ.

මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

- ❖ ගාලු උරුමය පදනමේ අනුමත බඳවා ගැනිමේ පටිපාටි සංශෝධනය කර ගැනිම.
- ❖ ගාලු කොටුව තුල ඇති රජයට අයත් ඉපැරණි ගොඩනැගිලි සංරක්ෂණය කර ගැනිම සහ ඒවා ඵලදායි පසු භාවිතයන්ට යොමු කිරිම.

අමාත්‍ය මණ්ඩලයේ අවධානය යොමු විය යුතු ආයතනයට අදාළ වෙනත් කරුණු

1. පනත සංශෝධනය

විගණන නිරීක්ෂණ ක්ෂේත්‍රය	විගණන නිරීක්ෂණය	විගණන නිර්දේශය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	කළමනාකාරණ මණ්ඩල සාමාජිකයන්ගේ යෝජනා
1.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් කළ යුතු වුවද, ඊට අනුකූලව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	මූදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ කිරීමට කටයුතු කළ යුතුය.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය රේඛීය අමාත්‍යාංශය මගින් කාලානුරූපීව පැවැත්වීම සිදුකළ යුතුය. අවසන් වරට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා ඇත්තේ 2019 මූල්‍ය වර්ෂය වෙනුවෙනි. ඒ අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතුව පවතින 2020 මූල්‍ය වර්ෂය සඳහා කඩිනමින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වන ලෙසට වන ඉල්ලීම රේඛීය අමාත්‍යාංශ ලේකම් වෙත දැනටමත් යොමුකර ඇත. ඒ අනුව ඉදිරියේදී පවත්වනු ලබන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා ජාතික විගණන කාර්යාලය වෙත යොමු කිරීමට සටහන් කර ගතිමි. කෙසේ වෙතත් ගාලු උරුමය පදනම විසින් 2020 මූල්‍ය වර්ෂය වෙනුවෙන් වන භෞතික තොග ගණනයක් (විකුණුම් තොග සහ සියලු දේපළ පිරියත උපකරණ) (Physical stock count) 2021/01/08 දින පවත්වන ලදී. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2022.02.28 වනදින කාර්යාල පරිශ්‍රයට පැමිණීමට නියමිත බව දැනටමත් අප වෙත ලිඛිතව දන්වා ඇත.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ වේ.
2.මූල්‍ය සමාලෝචන	(අ)ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020		2019 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල ගණනයේදී වාර්ෂික ක්ෂය ගැලපීමේ පැවැති ප්‍රායෝගික ගැටලු හේතුවෙන්, ක්ෂය ගැලපීම රු.318,458/-	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ

ය 2.1මූල්‍ය ප්‍රතිඵලය	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.55,286ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,956,108ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,900,822ක් හෙවත් සියයට 98.6ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.		ක් වූ අතර ඒ හේතුවෙන් රු.3,956,108/-ක අතිරික්තයක් ජනනය වීම සිදුවිය. නමුත් සලකා බලන 2020 වර්ෂයේ දී ක්ෂය වශයෙන් රු.3,656,518/-කුත් සහ ක්‍රමක්ෂය වශයෙන් රු.25,008/-කුත් මූල්‍ය ප්‍රතිඵල ගණනයේදී ගැළපීම් සිදුකර තිබීම හේතුවෙන් විගණන නිරීක්ෂණ මගින් පෙන්වා ඇති 98.6% පිරිහීම ඇති වී ඇත.	ඒ. ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිතගත ගැළපීම් නිවැරදිව සිදු කරන ලෙස කළමනාකාරීත්වයට උපදෙස් ලබා දෙන ලදී.
	(ආ) 2016 වර්ෂයේ රු.11,151,762ක් වූ දායකය 2017 සහ 2018 වර්ෂයන්හි දී පිළිවෙළින් රු.8,231,924ක් සහ රු.6,586,024ක් ලෙස අඩුවී 2019 වර්ෂයේ එය රු.10,788,979ක් දක්වා වර්ධනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී දායකය		විගණන නිරීක්ෂණය තුළින් පෙන්වා ඇති දායකය අඩුවීම 2019 වර්ෂයට සාපේක්ෂව 2.4ක් වේ.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් හා එකඟ වේ.

	රු.10,530,692ක් දක්වා නැවත අඩුවී තිබිණි.			
	(ඇ) 2016 වර්ෂයේ සියයට 22ක් වූ ශුද්ධ ලාභ අනුපාතය 2019 වර්ෂයේ දී සියට නමයක් දක්වා අඩුවී 2018 වර්ෂයේ දී එය 2% ක ශුද්ධ ලාභ අනුපාතයක් දක්වා අඩුවී තිබිණි. 2019 වර්ෂයේ ශුද්ධ ලාභ අනුපාතය සියයට 23 ක් දක්වා වර්ධනය වී 2020 වර්ෂයේ දී එය සියයට 0.4 දක්වා පහත වැටී තිබිණි.		මේ සඳහා ශුද්ධ ලාභ අනුපාතය පෙර වර්ෂයට සාපේක්ෂව 0.4%ක් දක්වා පහත වැටීම කෙරෙහි පහත සාධක අභිතකර අයුරින් බලපා තිබිණි. (අ) ආදායම් මූලාශ්‍ර අඩුවීම • ජායාරූප ගතකිරීම් ආදායම 67.7%කින් අඩු වීම • බදු ආදායම 36.45%කින් අඩු වීම • රජයේ අක් මුදල් ලබාදීම 18.04%කින් අඩුවීම • වෙනත් ආදායම් 0.52%කින් අඩුවීම • මීට අමතරව පැවැති කොවිඩ් -19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් සැලකිය යුතු කාලසීමාවක් රට අගුළු දමා පැවැතීම සහ සංචරණ සීමා කිරීම් වලට යටත්ව රට විවෘතව පැවතීමත් තුළ ආදායම් ප්‍රභවයන් පෙර වර්ෂයට සාපේක්ෂව අඩු වීමට ප්‍රමුඛ වශයෙන් බලපෑම් කර ඇත. (ආ) වියදම් මූලාශ්‍රයන් වැඩිවීම • පෙර වර්ෂයට සාපේක්ෂව ක්ෂය ගණනය 1008.35% කින් සහ ක්‍රම ක්ෂය වියදම 100%කින් ඉහළ යාම ශුද්ධ ලාභ අනුපාතය අඩු අගයක් ගැනීම කෙරෙහි බලපා ඇත.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකහ වේ. වාර්ෂික අතිරික්තයක් ජනනය වන අයුරින් විකල්ප ආදායම් මූලාශ්‍ර කෙරෙහි යොමු වන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.
3.මෙහෙයුම්	(අ) ගාල්ල කොටුවේ සදු මුර අට්ටාලයේ පිහිටි පැරණි	වැය කරන ලද මුදල් නියමිත	සදු ගැලරිය සංරක්ෂණය කර ගැලරියකට අවශ්‍ය පහසුකම්	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකහ

මෙ සමාලෝචනය 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා	ලන්දේසි යුද කාමරය සංරක්ෂණය කර ගාල්ලේ ඓතිහාසික උරුමය පිළිබිඹු කරන ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.11,760,121ක් වියදම් කර තිබුණද, එම සඳු මුර අට්ටාලය ප්‍රදර්ශන ගැලරියක් බවට පත් කර නොතිබුණි.	කාර්යන්ට යොදවා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	ස්ථාපනය කිරීම සඳහා 2014 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබීය. එසේම සඳු ගැලරියේ ප්‍රදර්ශන කුටිය සඳහා අවශ්‍ය ප්‍රතිමා සහ සිතුවම් සකස් කර විවෘත කිරීමේ මට්ටමක පැවතියද, 2017 දී එම ගැලරියේ සැලසුම වෙනස් කර අර්ථකථන සිතුවම් සමග ගැලරිය වැඩි දියුණු කල යුතු බව ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබීය. ගැලරියට අවැසි අතිරේක අර්ථකථන සිතුවම් නිර්මාණය කිරීමේ කටයුතු 2019 දී නිමා වුවත්, 2020 වර්ෂයේ දී අතුරු සම්මත ගිණුමෙන් ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් හා පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් 2020 වර්ෂයේදී ගැලරිය විවෘත කිරීමට නොහැකි විය. එනිසා එම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කෙරුණි. 2021.12.31 දින වන විට මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන් වලින් 95% ක ප්‍රතිශතයක් නිමවී තිබුණි. විගණන නිරීක්ෂණය සඳහා පිළිතුරු යැපයන මෙම මොහොත වන විට මෙම ගැලරිය මහජනතාවට විවෘත කළ හැකි මට්ටමක පවතී.	වේ.
	(ආ) ගාලු උරුමය පදනමට අවශ්‍ය බලතල ලබා ගැනීමට හා පදනම සඳහා ආදායම් උත්පාදනය නංවාලීම යන අරමුණු සඳහා 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම	පනත සංශෝධනය කරවා ගැනීමට කටයුතු කළ යුතුය.	ගාලු උරුමය පදනම 2015 සිට ගත වූ කාලය තුල අමාත්‍යාංශ කිහිපයක් යටතට පත් වූ අතර එම සෑම අවස්ථාවකදීම පනත සංශෝධනය පිළිබඳ විවිධ මට්ටමේ සාකච්ඡා අමාත්‍යාංශ මට්ටමින් සිදුවිණ. පනත සංශෝධනය සඳහා අවස්ථා කිහිපයකදීම පනතේ කෙටුම්පත් සකස් කර ඇත. අවසන් වතාවට ගාලු උරුමය පදනම “දක්ෂිණ සංවර්ධන, නීතිය හා	පනත සංශෝධනය ප්‍රමුඛ කාර්යයක් සේ සලකා මෙම අමාත්‍යාංශය යටතේ මෙය කඩිනමින් සිදු කරගන්නා මෙන් උපදෙස් ලබා දෙන ලදි.මෙහි මූලික

	පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඒ සඳහා 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළියෙල කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අදාළ සංශෝධනයක් සිදු කර නොතිබුණි.		සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයට" අයත් කාල සීමාවේදී, ගාලු උරුමය පදනම පනත සඳහා බලාත්මක අධිකාරියක් අවශ්‍ය වීම මත අමාත්‍යාංශය මගින් දක්ෂිණ බලකොටු අධිකාරී පනත (Southern Forts Authority Act) නමින් නව පනතක් කෙටුම්පත් වීම ආරම්භ විය. එහි පළමු කෙටුම්පත 2018 වසරේදී නීති කෙටුම්පත් සම්පාදක වෙත දක්ෂිණ සංවර්ධන අංශය මඟින් ඉදිරිපත් කර ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් එම පනත් කෙටුම්පත ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියටද ඉදිරිපත් කර ඇත. 2018.12.28 සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනයේ දී ගාලු උරුමය පදනම දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශ විෂය පථයෙන් ඉවත් කර වෙනත් අමාත්‍යාංශයක් යටතට පත් කරන ලදි. ඉන් පසුව එහි ඉදිරි කටයුතු සඳහා අදාළ ලේඛන දක්ෂිණ සංවර්ධන අතුරු මණ්ඩලය මඟින් වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත 2019.07.18 වන දින ඉදිරිපත් කර ඇත. මෙම වකවානුවේ දී ගාලු උරුමය පදනම අයත් අමාත්‍යාංශය නැවත වෙනස් වූ අතර එය නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට පත් විය. පනත සංශෝධනයේ ඉදිරි කටයුතු අමාත්‍යාංශ මට්ටමින් ඉදිරියට කරගෙන යාම සඳහා අප විසින් දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයෙන් ගෙන්වා ගෙන ඇති අදාළ ලේඛන නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික	පියවර ලෙස ගාලු උරුමය පදනමේ මූලිකත්වයෙන් කමිටුවක් පත්කර ගන්නා ලෙස උපදෙස් ලැබුණි. කමිටුව සඳහා නීතීඥ නාලනී අබේවර්ධන මෙ.වි. , නීතීඥ ලලිත් පතිරණ මහතා, දිස්ත්‍රික් ලේකම් තුමා, සහ ගාලු උරුමය පදනමේ සංවර්ධන නිලධාරී තරංග ලියනාරච්චි මහතා නම් කරගන්නා ලදි. මේ සඳහා කළමනාකරණ මණ්ඩලයේ එකඟතාව ලැබුණි.

			කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇත. මේ වන විට ගාලු උරුමය පදනම අයත් අමාත්‍යාංශය නැවත වෙනස් වී ඇති අතර දක්ෂිණ බලකොටු අධිකාරී පනත (Southern Forts Authority Act) සකස් කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක වී නොමැත. එබැවින් මේ වන විට 1994 අංක 7 දරන පාර්ලිමේන්තු පනත ප්‍රකාරව පදනමේ වැඩ කටයුතු සිදු කරගෙන යනු ලබන අතර, දැනට පවතින තත්ත්වය යටතේ අවශ්‍යවන සංශෝධනයන් සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ අදහස් විමසා ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කරමි.	
	(ඇ) විදී ලාම්පු සවි කිරීමේ පළමු අධියර වෙනුවෙන් රු.1,784,544 ක්ද, දෙවන අදියර වෙනුවෙන් රු.2,395,266 ක්ද ලෙස පදනම විසින් වියදම් දරා නගර සභාව පවරා දී තිබුණද, වැය වූ රු.4,179,810 ක මුදල විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 16 දින තෙක් විදුලි බල සමාගමෙන් ප්‍රතිපූර්ණය කරවා ගෙන නොතිබුණි.	විදුලිය වෙනුවෙන් නොව වීදි පහන් වෙනුවෙන් වියදම් ප්‍රතිපූර්ණය ට විදුලි බල මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය	ගාලු උරුමය පදනම විසින් 2017 සහ 2019 යන වර්ෂවල ගාල්ල කොටුවේ පැරණි හැඩයේ වීදී ලාම්පු 156ක් අදියර 02ක් යටතේ අලුත්වැඩියා කරනු ලැබීය. මෙම පැරණි හැඩයේ වීදී ලාම්පු 1990 දශකයේ මුල් අවදියේ එවකට ගාලු උරුමය කමිටුව විසින් වරාය අධිකාරියේ ප්‍රතිපාදන යටතේ සකස් කොට සවිකරනු ලැබූ ඒවා වෙයි. මෙම පහන් පද්ධතිය ලංකා විදුලි බල පුද්ගලික සමාගමේ දේපොළක් නොවන අතර එකල සවිකළ පසු නඩත්තු කරමින් පවත්වාගෙන ආවේ ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු වන ගාල්ල මහා නගර සභාව විසිනි. ලංකා විදුලි පෞද්ගලික සමාගම විදුලි සැපයුම පමණක් ලබා දෙයි. කාලයක් තිස්සේ මෙම පැරණි පහන් අක්‍රියව පැවතීම ලෝක උරුම ගාල්ල කොටුවේ ජීවත්වන ප්‍රජාවටත්, ගාල්ල කොටුව නැරඹීමට පැමිණෙන	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ වේ.

			සංචාරකයින්ටත් දැඩි දුෂ්කර තත්ත්වයක් ඇති වීම නිසා ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩල අනුමැතියට යටත්ව ගාලු උරුමය පදනමේ ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස එකී පැරණි විදුලි පහන් අලුත්වැඩියා කර නඩත්තුව සඳහා ගාලු මහා නගර සභාව වෙත භාර දෙන ලදි. මෙම පැරණි පහන් පද්ධතිය ලංකා විදුලි පුද්ගලික සමාගමේ දේපොළක් නොවන බැවින් වියදම් ප්‍රතිපූර්ණය කිරීම අවශ්‍ය නොවන බව සඳහන් කිරීමට කැමැත්තෙමි. තවද මාර්ග විදුලිය ශ්‍රී ලංකාවේ නොමිලයේ ලබා දෙන සේවාවක් වන අතර ඒ සඳහා කිසිම ගාස්තුවක් අය නොකෙරෙන බවද සඳහන් කරනු කැමැත්තෙමි.	
	(ඇ) 2020 ජනවාරි 01 දිනට පදනමේ ගබඩාව තුළ රු.698,497 ක වටිනා පොත් හා අත් පත්‍රිකා තොගයක් ඉතිරිව පැවැතියදි, වර්ෂය තුළ අවශ්‍යතාවය නොසලකා හැර රු.275,000 ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණි. මෙම නිසා 2020 දෙසැම්බර් 31 දින වන විට රු.954,634 ක ඉතිරි තොග ගබඩාව තුළ නිෂ්කාර්යව	තොග තබා ගැනීමේදී ද්‍රවශීලතාවය ගැන සලකා උපරිම කාරක ප්‍රාග්ධන තුලනයකින් කටයුතු කළ යුතුය.	ගාලු උරුමය පදනම ප්‍රකාශනයක් වන "පවුරක උරුමය" ග්‍රන්ථයෙහි ඉංග්‍රීසි මාධ්‍යයෙන් යුත් ග්‍රන්ථය "Heritage of a walled city" මැයෙන් 2020 වර්ෂයේ ඔක්තෝබර් මස රු.275,000/- (රුපියල් දෙලක්ෂ හැත්තෑ පන්දාහක්) වැයකර ග්‍රන්ථ දාහක් මුද්‍රණය සිදු කර තොරතුරු මධ්‍යස්ථානයේ අලෙවියට එක් කරන ලදී. 2020/12/31 දින වන විට ඉතිරි තොග වටිනාකම රු.954,634/=ක් පැවතීමට පහත හේතු ප්‍රධාන වශයෙන් බලපෑ බව සඳහන් සඳහන් කිරීමට කැමැත්තෙමි. • කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය මත සැලකිය යුතු කාලසීමාවක් රට අගුළු දමා පැවතීම. • කෝවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය මත දැඩි සංචරන සීමා යටතේ රට විවෘතව පැවතීමේ දී දේශීය සංචාරකයන් මෙන්ම විදේශීය සංචාරකයන් ගාලුකොටුව වෙත පැමිණීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ වේ. ඉදිරියේදී අලෙවිය සඳහා පොත් මිලදී ගැනීමේදී සහ මුද්‍රණයේ දී පවතින තොග මට්ටම් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව නව තොග මිලදී ගැනීම් සිදුකරන ලෙසට කළමනාකරණයට උපදෙස් ලබා දෙන ලදී.

	පැවතුණි.		අවම වීමෙන් අලෙවි අවස්ථා අඩු වීම. කෙසේවෙතත් ඉදිරියේදී තොරතුරු මධ්‍යස්ථානයේ අලෙවි පිරිවැටුම ඉහළ නංවා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගන්නා බව සඳහන් කරමි. ජාතික විගණන කාර්යාලයේ මෙම විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු සපයන මොහොතේ ආසන්නතම වර්ෂය අවසානය වන 2021.12.31 දිනට පවතින තොග වටිනාකම් පහත දක්වා ඇත. පොත් 704,076 අත් පත්‍රිකා 191,765 මුළු තොග වටිනාකම 895,841	
	(ඉ) රු.7,126,837 ක් වැය කර ඉදිකර තිබූ කෆා වැසිකිළි පද්ධතිය සහ පල්ලිය විදිය, වැසිකිලි පද්ධතිය ආදායම උපයා ගැනීම සඳහා ගිවිසුමකින් තොරව මහ නගර සභාවට පවරා දී තිබුණි. එම නිසා පදනමට ලබා ගැනීමට තිබූ ආදායම් අහිමි වී තිබුණි.	කොටුව තුල තුළ ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව පදනමට ඇති බැවින් ආදායම් උත්පාදනය කිරීම පිළිබඳ අවධානය යොමු කළ යුතුය.	ගාල්ල කොටුවේ බාලදක්ෂ මාවතේ ඉදිකර තිබූ කෆා වැසිකිළි පද්ධතිය 1990 දශකයේ යම් කිසි දානපති ආයතනයක් විසින් ඉදිකර තිබූ එකක් වන අතර කාලයක් මුළුල්ලේ එය අතහැර දමා තිබුණි. එසේම එකී ගොඩනැගිල්ල ගාල්ල කොටු බැම්ම අසළ ඉදිකර තිබූ අතර එම ඉදිකිරීම ගාල්ල කොටුවට අනන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණවලට හානිකර ඉදිකිරීමක් විය. නව වැසිකිළියක් ඉදිකිරීම සඳහා වෙනත් ස්ථානයක් නොමැති වීමත්, ගාල්ල කොටුවට පැමිණෙන සංචාරකයින් සඳහා වැසිකිළි අවශ්‍යතාවය දැඩි වීමත් නිසා ගාලු උරුමය පදනම විසින් සිදු කරන ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස බාලදක්ෂ මාවතේ පැරණි වැසිකිළි පද්ධතිය ගලවා දමා ගාල්ල කොටුවට ගැළපෙන පරිදි වැසිකිළි පද්ධතියක් නිර්මාණය කිරීම සුදුසු බව ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය. ඒ අනුව ගාලු උරුමය පදනමේ	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම හා එකඟ වේ.

			කළමනාකරණ මණ්ඩල කමිටු සාමාජිකයකු ද වන ගාල්ල මහ නගර සභාවේ එකඟතාවය මත ප්‍රාග්ධන ව්‍යාපෘතියක් ලෙස පැරණි කෆා වැසිකිළි පද්ධතිය නවීන වැසිකිළි පද්ධතියක් ලෙස සංවර්ධනය කර එහි නඩත්තු කටයුතු සඳහා ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙනු ලැබීය. පල්ලිය වීදියේ පැරණි පොලිස් නිළ නිවාසය අසළ ඉදිකර, පොලිස් නිළ නිවාස නිමියන් විසින් භාවිත කළ වැසිකිළි පද්ධතිය ද ගාලු උරුමය පදනම විසින් අලුත්වැඩියා කර නඩත්තුව සඳහා ගාල්ල මහා නගර සභාව වෙත භාර දෙන ලදි. මෙකී වැසිකිළි පද්ධති දෙකම සංවර්ධනය කරනු ලැබුයේ ආදායම් උත්පාදනය කිරීම සඳහා නොව මහජනතාවට සේවයක් සැපයීම උදෙසාය. පල්ලිය වීදියේ වැසිකිළි පද්ධතිය මහජනතාවට විවෘත වනවා මෙන්ම පැරණි පොලිස් ගොඩනැගිල්ල සංරක්ෂණය කළ පසුව යොදාගනු ලබන වාණිජ කටයුතුවලදී ද භාවිත කිරීමට නියමිතය. ඉදිරියේදී මෙලෙස ගාලු උරුමය පදනමේ වත්කම් ලෙස සටහන්ව ඇති වැසිකිළි පද්ධති, අප වත්කම් ලේඛනයෙන් ඉවත් කොට ගාල්ල මහා නගර සභාවේ වත්කම් තුළට ඇතුලු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා කොට අවසන් එකඟතාවකට පැමිණීමට අපේක්ෂා කරමි. තවද, ගාලු උරුමය පදනම පිනිටුවනු ලැබූ 1994 අංක 07 දරන ගාලු උරුමය පදනම පනතේ සඳහන් වන “ගාලු කොටුව නැරඹීමට	

			පැමිණෙන සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සැලැස්වීම සහ එහි පදිංචිකරුවන්ගේ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ අරමුණු" අනුව මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇති බවද සඳහන් කරමි.	
	(ඊ) තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාළව පදනම් වීසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් හඳුනාගෙන එම කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.	තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	අදාළ කාලය වන විට ගාලු උරුමය පදනම තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ කාර්යයන් හඳුනා ගැනීමේ අදියරේ තිබූ බැවින් ඒවා වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබිණි. ඒ හේතුව නිසාම මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂික අයවැයට ඇතුළත් කර නොමැත. 2021 වාර්ෂික සැලැස්ම සකස් කිරීමේදී ඒවා ඇතුළත් කර ඇත.	ඉදිරියේ දී තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ කාර්යයන් හඳුනාගෙන ඒවා වාර්ෂික සැලැස්මට ඇතුළත් කිරීමට කටයුතු කිරීමට කළමනාකාරිත්වයට උපදෙස් ලබා දෙන ලදි.
4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය 4.1 අයවැය	2020 අයවැය ප්‍රරෝකථනයන් හා සත්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 42.21ක සිට සියයට 93.5ක විචලතාවයන් නිරීක්ෂණය විය.	අයවැය සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී සැලසුම් සහගත පරිදි කටයුතු කළ යුතුය. කොවිඩ් 19 වසංගත තත්වය සමග ඉදිරියට	විගණක විසින් මේ සම්බන්ධයෙන් පෙන්වා ඇති නිරීක්ෂණයට අදාළ විචලතා ශ්‍රේණි වෙන් වෙන්ව පහත දක්වා ඇත. 01. කාර්යාල උපකරණ මිලදී ගැනීම හා, ලැට්ස් සවි කිරීම 2020 වර්ෂයේ දී ගාලු උරුමය පදනමේ ප්‍රාග්ධන ස්වරූපයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් පළමුවෙන්ම රු.1,000,000ක් වෙන් කරවා ගෙන තිබුණි. නමුත් 2020 අගෝස්තු මස තුළ දී අයවැය ප්‍රතිපාදන කපා හැරීමක්	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් හා එකඟ වේ.

පාලනය		යාමට අවසර වැඩපිළිවෙලවල් නිවැරදිව සංශෝධනය කර අවස්ථානුකූලව කටයුතු කළ යුතුය.	සිදු කරන ලදි. ඒ වන විටත් කාර්යාලයේ ලැට්ස් සවි කිරීමේ කර්මාන්තය සිදු කරමින් පැවති බැවින් 2020 සංශෝධිත අයවැය ප්‍රතිපාදන ඉක්මවා සත්‍ය වියදම 42.21%කින් ඉහළ යෑමක් සිදු වී ඇත. 02. දැනුවත් කිරීමේ වැඩසටහන් මේ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදිත වටිනාකම 68.5%කින් ඉතිරිවීම කෙරෙහි කොවිඩ් 19 වසංගත තත්ත්වය සෘජුවම බලපෑම් කරන ලදි. 03. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය නිරීක්ෂණය ගාලු උරුමය පදනම් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය නිරීක්ෂණය යන්නෙන් කිසිදු ව්‍යාපෘතියක් 2020 වර්ෂයේ සිදු කර නොමැති බව කාරුණිකව දන්වමි. විගණනය විසින් මෙම විගණන විමසුම තුළින් පෙන්වා දීමට අදහස් කරනුයේ තොරතුරු මධ්‍යස්ථාන පරිශ්‍රය නවීකරණ ව්‍යාපෘතිය විය යුතු බව හැඟේ. 2020 වර්ෂයේ දී තොරතුරු මධ්‍යස්ථාන පරිශ්‍රයේ නවීකරණ කිහිපයක් ම සිදු කිරීමට බලාපොරොත්තු වූ නමුත් රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රට අගුලු දැමීම හේතුවෙන් එම නවීකරණයන් සිදු කිරීමට නොහැකි විය. එබැවින් ප්‍රතිපාදිත මුදල් 93.5%කින් ඉතිරි වී ඇත. 04. සදු මුර අට්ටාල යුධකාමරයේ චිත්‍ර නිර්මාණය 2020 වර්ෂයේ දී සදු මුර අට්ටාලය යුධකාමරයේ නිම කිරීම් අවසන් කිරීමට බලාපොරොත්තු වූවද, රට තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ රට අගුලු දැමීම හේතුවෙන් එම නවීකරණයන් සිදු කර වැඩ අවසන් කිරීමට නොහැකි විය. එබැවින් ප්‍රතිපාදිත මුදල් 70.7%කින් ඉතිරි වී ඇත.	